ඓකික නිබන්ධ අංකඃ 01

*Research Monograph No. 01*

# ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල වර්තමාන තත්ත්වය සහ එම පාසල් වැසීයාම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනයක්

# An investigation on the current status of the small schools in Sri Lanka and action to be taken to avert the closure of such schools


අධ්‍යාපන අමාත්‍යාංශය
ඔක්තෝබර්, 2020

**Ministry of Education**
October, 2020

ඓකික නිබන්ධ අංක: 01

**Research Monograph No: 01**

# ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල වර්තමාන තත්ත්වය
# සහ
# එම පාසල් වැසී යාම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග
# පිළිබඳ විමර්ශනයක්

# An investigation on the current status of small schools in Sri Lanka
# and
# action to be taken to avert the closure of such schools


පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඔක්තෝබර්, 2020

**Research and Development Branch**
**Ministry of Education**
**October, 2020**

# පෙරවදන

කුඩා පාසල් වැසී යාම මෙන් ම පවත්වා ගෙන යාම ද ගැටලුකාරී බවට හේතු සාධක මතුව ඇති බැවින් මේ පිළිබඳව නිවැරදි ප්‍රතිපත්ති තීරණ ගැනීමට පළමුව පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු බව මාගේ අපේක්ෂාව විය. ඒ සඳහා ඉදිරිපත් වූ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව ප්‍රශංසාත්මකව අගය කරමි.

පර්යේෂණය සඳහා භාවිත කර ඇත්තේ පර්යේෂණාශ්‍රිත ලේඛන ක්‍රමයේ නවතම විකාශනයක් වන ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයයි. එමගින් ගැටලුවේ විවිධ දිශානති ඔස්සේ සිදු කරන ලද පර්යේෂණවල අනාවරණ එකට කැටි කොට ගැටලුව සඳහා වඩාත් හොඳ විසඳුම් යෝජනා හඳුනා ගැනීම අපේක්ෂා කර ඇත. එසේම, මෙමගින්, පිළිගත් පර්යේෂණ අධ්‍යයන රාශියකින් දැනටමත් හඳුනාගත් ගැටලු සඳහා පර්යේෂණාත්මකව විසඳුම් සෙවීමට වඩාත් සුදුසු පර්යේෂණ ආකෘතියක් හඳුනා ගැනීමට ද ශාඛාවට හැකි වී ඇත. ඒ සඳහා පර්යේෂකයකු ලෙස පර්යේෂණ හා සංවර්ධන ශාඛාවට සහායවීමට ඉදිරිපත් වූ සුමිත් පරාක්‍රමවංශ මහතාට ද, අවශ්‍ය දත්ත සැපයීමෙන් සහාය වූ සංඛ්‍යාලේඛන ශාඛාවට ද ස්තුතිවන්ත වෙමි.

මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් කුඩා පාසල් වැසීයාම වැළැක්වීම සහ ඒවා නඟා සිටුවීම පිණිස ඉදිරිපත්කර ඇති නිර්දේශ සහ යෝජනා විද්වත් මණ්ඩලයක් වෙත ඉදිරිපත් කොට මෙම ගැටලුව සඳහා විසඳුම් ලෙස ප්‍රතිපත්තිමය යෝජනාවක් සහ දීර්ඝකාලීන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට යෝජනා කරන අතර එහි දී අධ්‍යාපන නාස්තියක් නොවන ලෙසට සහ සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීමට ද යෝජනා ඉදිරිපත් වනු ඇති බව උදක්ම අපේක්ෂා කරමි.

**ආචාර්ය මධූරා එම්. වෙහැල්ල**
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශය

## Foreword

The necessity of a comprehensive study on closing up of small schools and upholding of such schools was at utmost priority before arriving at any policy decision with that regard since both these matters have clear evidence to prove that they are entrenched with issues inherited to them. Therefore, I take this opportunity to place on record the commendable task carried out by the Research and Development Branch of the Ministry of Education in this regard.

The research study has exploited the newly emerged approach in documentary research method namely, Qualitative Systematic Review. It has led the path to identify the best possible solutions for the problems encountered by bringing together the findings of various research studies conducted in different angles of the issue. As a consequence, the research and development branch has been able to identify a suitable research study format in order to find solutions of more rational, taking the advantage of several accepted research studies conducted regarding already identified issues on the same area of study. Hence, my sincere thank is also extended to Mr. Sumith Parakramawansa who has given his fullest support as the main writer of this monograph as well as to the Statistics Branch of the Ministry for providing necessary data and information.

Further, it is suggested that the recommendations and proposals made herein to avert the closure of small schools and to uplift them be submitted to a panel of eminent scholars and come up with a policy proposal in this regard together with a comprehensive long-term plan of action as to avoid an education wastage and ensure a quality education for students.

**Dr. (Mrs.) Madhura M. Wehella**
Additional Secretary
(Policy, Planning & Performance Review)
Ministry of Education

**යොමු කිරීම**

**ආචාර්ය මධූරා. එම්. වෙහැල්ල මිය**
අතිරේක ලේකම්, (ප්‍රතිපත්ති, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Direction**

**Dr. (Mrs.) Madhura M. Wehella**
Additional Secretary, (Policy, Planning & Performance Review)
Ministry of Education

**මග පෙන්වීම**

**එස්. කේ. ලීලාරත්න මිය**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Guidance**

**Mrs. S. K. Leelaratna**
Director of Education (Research & Development)
Ministry of Education

**අධ්‍යයන මග පෙන්වීම**

**විශ්‍රාමික මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය**
විවෘත විශ්වවිද්‍යාලය, නාවල

**ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු මහතා**
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**Academic Guidance**

**Retired Professor (Mrs) G. D. Lekamge**
Open University of Sri Lanka, Nawala

**Dr. Godwin Kodithuwakku**
Retired Deputy Director-General
National Institute of Education

**පර්යේෂණ රචනය**

**සුමිත් පරාක්‍රමවංශ මහතා**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන)
කලාප අධ්‍යාපන කාර්යාලය, ඇල්පිටිය

**ඒ. ආර්. එස්. පෙරේරා මිය**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Research Writing**

**Mr. Sumith Parakramawansa**
Deputy Director of Education (Administration)
Zonal Education Office, Elpitiya

**Mrs. A. R. S. Perera**
Deputy Director of Education (Research and Development)
Ministry of Education

**පර්යේෂණ සහාය**

**දිල්රුක්ෂි පෙරේරා මිය**
සංවර්ධන නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**අනුරාධා නිර්මලී මිය**
සංවර්ධන නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Research Assistance**

**Mrs Dilrukshi Perera**
Development Officer (Research and Development Perera)
Ministry of Education

**Mrs Anuradha Nirmalie**
Development Officer - (Research and Development Perera)
Ministry of Education

**පිටකවර නිර්මාණය හා පිටු සැකසුම**

**ඒ. ආර්. එස්. පෙරේරා මිය**
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Cover Page & Page Designing**

**Mrs. A. R. S. Perera**
Deputy Director of Education (Research & Development)
Ministry of Education

**අක්ෂර සංයෝජනය**

**බී. ජී. බුද්ධි හංසිකා මෙය**
පරිගණක පුහුණු, (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය

**Type Setting**

**Ms. B. G. Buddhi Hansika**
Computer Trainee, (Research and Development Branch)
Ministry of Education

**පටුන**

# Contents


| | **පිටු අංකය** **Page No.** |
|---|---|
| විධායක සංක්ෂිප්තය | ix - xi |
| Executive Summary | xii - xiv |
| 1.0 හැඳින්වීම | 01-14 |
| 2.0 අධ්‍යයනයේ අරමුණු | 15 |
| 3.0 අධ්‍යයන ක්‍රමවේදය | 15-16 |
| 4.0 පර්යේෂණාශ්‍රිත ලේඛන විමර්ශනය | 16-22 |
| 4.1 කුඩා පාසල්වල ගුණාත්මක සංවර්ධනය | 17-19 |
| 4.2 කුඩා පාසල් විදුහල්පති කළමනාකරණ උපායමාර්ග | 19-20 |
| 4.3 කුඩා පාසල් නගා සිටුවීම | 20-21 |
| 4.4 කුඩා පාසල් සංවර්ධනය කිරීමේ විදුහල්පති අත්දැකීම් | 21-22 |
| 5.0 පර්යේෂණාශ්‍රිත ලේඛන ඇසුරෙන් හඳුනා ගත් අනාවරණ | 22-37 |
| 5.1 ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් **යොදා** ගන්නා ලද සංවර්ධන උපායමාර්ග සහ අත්දැකීම් | 22-29 |
| 5.1.1 ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග | 22-25 |
| 5.1.2 කුඩා පාසල් විදුහල්පති අත්දැකීම් | 25-29 |
| 5.2 කුඩා පාසල් මුහුණ පා ඇති ගැටලු | 29-32 |
| 5.2.1 පරිපාලනමය ගැටලු | 29-30 |
| 5.2.2 සිසුන් සම්බන්ධ ගැටලු | 30 |
| 5.2.3 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු | 30-31 |
| 5.2.4 ප්‍රජාව සම්බන්ධ ගැටලු | 31 |
| 5.2.5 මානව සහ භෞතික සම්පත් සම්බන්ධ ගැටලු | 31-32 |
| 5.3 කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නගා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා | 32-37 |
| 6.0 උක්ත අනාවරණ භාවිත කරමින් ශ්‍රී ලාංකේය කුඩා පාසල් පද්ධතිය නගා සිටුවීම පිණිස ඉදිරිපත් කරනු ලබන නිර්දේශිත පියවර | 37-39 |
| 6.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කුඩා පාසල් ඒකකයක් ස්ථාපිත කිරීම | 37-38 |
| 6.2 විදුහල්පති නායකත්වය | 38 |
| 6.3 සුවිශේෂී ගුරු,විදුහල්පති පුහුණු පාඨමාලා **හා** අභිප්‍රේරණය | 38 |
| 6.4 බහු ශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර ප්‍රවර්ධනය | 38-39 |
| 6.5 ප්‍රජා දායකත්වය සහ ප්‍රජා සංවර්ධනය | 39 |
| 6.6 අධීක්ෂණය සහ සුසාධ්‍යකරණය | 39-40 |
| 6.7 සම්පත්කරණය | 40 |
| 7.0 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 40-43 |
| ඇමුණුම 1 | 44-45 |

## වගු ලේඛනය

**පිටු අංකය**


| | | |
|---|---|---|
| **වගු අංක 1.** | පාසල් වැසී යාමට බලපෑ හේතු අනුව පාසල් සංඛ්‍යාව (2014 - 2018) | **02** |
| **වගු අංක 2.** | ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් ප්‍රවර්ගවල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වනු ලබන ප්‍රතිශතවල විචලනය (2016- 2018) | **03** |
| **වගු අංක 3.** | සිසුන් 100ට අඩු පාසල් පළාත් අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය (2016 - 2018) | **07** |

# විධායක සංක්ෂිප්තය

සමාජානුයෝජන කාරකයක් ලෙස පාසලේ වැදගත්කම පුළුල් ලෙස පිළිගෙන තිබුණ ද, 2014 සිට වසර හතරක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ පාසල් 45ක් වැසී ගොස් ඇත. මෙම තත්ත්වය උද්ගත වීමට හේතු වී ඇත්තේ අඩු සිසුන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන කුඩා පාසල්වලින් සිසුන් ඉවත් ව යාම හෝ එම පාසල්වලට පසුගිය වර්ෂවලට වඩා අඩු සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් වීම යි. මෙසේ ඉවත් ව යන සිසුහු පාසල් පද්ධතියෙන් ඈදහැලෙති. නැතහොත් වැඩි සිසුන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන විශාල ජනප්‍රිය පාසල්වලට ඇතුළත් වෙති. මේ ආකාරයට ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය විශාල ජනප්‍රිය සහ බලවත් පාසල් ලෙසත් කුඩා පාසල් ලෙසත් දෙපැත්තට බෙදී යනු දක්නට ලැබේ. සමහර ජනප්‍රිය පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව දහස් ගණනින් වර්ධනය වී ඇති අතර ඒවා පාලනය කර ගත නොහැකි තත්ත්වයට පත් ව තිබේ. අනෙක් අතින් ගම්බද සහ අවාසිදායක ප්‍රදේශවල කුඩා පාසල් ක්‍රමයෙන් කුඩා වී වැසී යන තත්ත්වයට පත් වී ඇත. මෙය පාසල් ධ්‍රැවකරණය (Polarization) ලෙස හැඳින්වේ. මේ හේතුවෙන් දුෂ්කර අවාසිදායක පරිසරවල වෙසෙන ජනතාවට පුළුල් ලෝකයට අවතීර්ණ වීමට ඇති එක ම පිවිවහල වන  කුඩා පාසල් වැසීයාමත් එහි ප්‍රතිඵලයක් ලෙස  සමාජ ආර්ථික ගැටලු ඇති වීමත් දැකිය හැකි ය. එබැවින් පාසල් පද්ධතියේ කුඩා පාසල්වල වර්තමාන තත්ත්වය විමර්ශනය කොට ඒවායේ දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීම පිණිස පර්යේෂණ අනාවරණ පදනම් කර ගෙන යෝජනා ඉදිරිපත් කිරීම පිණිස සිදු කරන ලද මෙම අධ්‍යයනය කාලීන ව වැදගත් ය. එමගින් සිසුන් නොමැති වීම නිසා පාසල් වැසී යාමේ ගැටලුව ද විසඳීමට හැකි වනු ඇත.

කුඩා පාසල් ආශ්‍රිතව සිදු කරනු ලැබූ අධ්‍යයනවලින් ඉදිරිපත් කර ඇති අනාවරණ සහ නිර්දේශ අධ්‍යයනය කර ඒ සඳහා ගත යුතු පියවර ඉදිරිපත් කිරීම මෙම ලේඛන අධ්‍යයනයේ  අරමුණ  වේ. මෙම අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය (Qualitative systematic review) යි. කුඩා පාසල්වල ගුණාත්මක සංවර්ධනය, කුඩා පාසල් විදුහල්පති කළමනාකරණ උපායමාර්ග, කුඩා පාසල් නඟා සිටුවීම සහ  කුඩා පාසල් සංවර්ධනය කිරීමේ විදුහල්පති අත්දැකීම් යන තේමා යටතේ සිදු කර ඇති අධ්‍යයන දහයක් පරිශීලනය කරන ලදි. ඒ අනුව, එම

අධ්‍යයනවලින් ඉදිරිපත් කර ඇති අනාවරණ ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග, අත්දැකීම්, කුඩා පාසල් මුහුණ පා ඇති ගැටලු, කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නගා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා යන තේමා ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග යටතේ, හවුල් තීරණ ගැනීම සහ ප්‍රජා සහභාගිත්වය, විදුහල්පති නායකත්වය, සැලසුම්, අරමුදල් සම්පාදනය, ආකර්ශනීය නායකත්වය, අලෙවිකරණ උපායමාර්ග සහ සම්පත් කළමනාකරණය යන කරුණු ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. කුඩා පාසල් විදුහල්පති අත්දැකීම් යටතේ, සු/ජොහානාදන් කණිටු විදුහල, බ/වලස්බැද්ද විදුහල, ත්‍රි/ මහවැලි පුර විද්‍යාලය සහ බප/ හෝ /මානකඩ කනිෂ්ඨ විද්‍යාලය යන කුඩා පාසල් හතර සංවර්ධනය කිරීමේ දී එම විදුහල්පතිවරුන් සිවු දෙනාගේ ස්ව ව්‍යවහාර ප්‍රත්‍යවේක්ෂණ විශ්ලේෂණය කර ඇත. කුඩා පාසල් මුහුණ පා ඇති ගැටලු යටතේ, පරිපාලනය සම්බන්ධ ගැටලු, සිසුන් සම්බන්ධ ගැටලු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු, ප්‍රජාව සම්බන්ධ ගැටලු සහ මානව සහ භෞතික සම්පත් සම්බන්ධ ගැටලු යන කරුණු විශ්ලේෂණය කරන ලදි.

කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නගා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා යටතේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ කුඩා පාසල් ඒකකයක් ස්ථාපිත කිරීම, විදුහල්පති නායකත්වය, සුවිශේෂී ගුරු, විදුහල්පති පුහුණු පාඨමාලා, අභිප්‍රේරණය, ප්‍රජා දායකත්වය, ප්‍රජා සංවර්ධනය, අධීක්ෂණය, සුසාධ්‍යකරණය සහ සම්පත්කරණය යන ශීර්ෂ ඔස්සේ විශ්ලේෂණය කොට පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1. **කුඩා පාසල් සඳහා** අධ්‍යාපන අමාත්‍යාංශයේ **වෙන ම ඒකකයක්** ස්ථාපිත කර, කුඩා පාසල්වල මනා ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම පිණිස සුදුසු වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීම
2. කුඩා පාසල් යන්න වෙනුවට **වෙනත් නාමයක්** භාවිත කිරීම සහ ඒ පිළිබඳ ව ප්‍රජාවේ පවතින ආකල්පය වෙනස් කිරීම පිණිස සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම
3. කුඩා පාසල් බල ගැන්වීම පිණිස **දක්ෂ විභව්‍යතා සහිත විදුහල්පතිවරුන්** පත් කිරීම සහ එම පාසල්වල **නව්‍යකෘත ව්‍යවහාර (innovative practices)** දිරි ගැන්වීම

4. ක්‍රියාකාරී ඉගෙනුම්, බහු ශ්‍රේණි ඉගැන්වීම් සහ අන්තර්කරණය යන සුවිශේෂ ඉගැන්වීම් ක්‍රමෝපා පිළිබඳ ව ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට **සුවිශේෂ පුහුණු** ලබා දීම
5. කුඩා පාසල්වල ගුරුභවතුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ සුවිශේෂී **දායකත්ව ඇගයීම**ට සහ ඔවුන් **අභිප්‍රේරණය** සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
6. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා **දෙමාපියන්ගේ සහභාගිත්වය** ප්‍රවර්ධනය කිරීම
7. දරුවන්ගේ දෛනික **පාසල් පැමිණීම**, දරුවන් **ඉගෙනීමේ කාර්යය සඳහා** උනන්දු කරවීම පිණිස **විධිමත් වැඩපිළිවෙළක්** සකස් කිරීම
8. ප්‍රජා දායකත්වය සහ ශිෂ්‍ය අභිප්‍රේරණය ඉහළ නැංවීම පිණිස ප්‍රජා සම්පත්දායකයන් ලවා ප්‍රාදේශීය කර්මාන්ත සහ ප්‍රාදේශීය සංස්කෘතික අංග ඇතුළත් **දේශීය ඥානය (local wisdom) පිළිබඳ වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම
9. පාසලේ සංවර්ධනය පිණිස **දෙමාපියන්ගේ සහභාගිත්වය** ලබා ගැනීම
10. ප්‍රජාව වෙනුවෙන් **නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්** සංවිධානය කිරීම
11. කාර්ය මණ්ඩල විභව්‍යතා ප්‍රත්‍යක්ෂ කර ගනිමින් පාසල සියලු අංශවලින් ඉහළ නැංවීම පිණිස **සහායිත අධීක්ෂණ පටිපාටියක්** ස්ථාපිත කිරීම
12. කුඩා පාසල් **බාහිර ඇගයීම පිණිස වෙන ම නිර්ණායක** හඳුනා ගැනීම
13. පාසලකට ප්‍රශස්ත ඉගෙනුම් මට්ටමක් සාධනය කර ගැනීමට අවශ්‍ය සම්පත් මොනවා දැයි වාස්තවික මිනුම් ක්‍රම මගින් තීරණය කිරීම හා එම සම්පත් දැනට තිබෙන පාසල් අවශ්‍යතා සළකා **ප්‍රමුඛතා ලේඛනයකට අනුව** ලැයිස්තු ගත කර ඒ අනුව **සම්පත් අවශ්‍යතා සැපිරීම**

# Executive Summary

Despite the fact that the importance of the school has been widely accepted as a factor of socialization, 45 no. of schools have been closed in Sri Lanka during the period of past four years since 2014. This has been caused either due to leaving students from small schools where a lesser number of students are learning or admitting fewer number of students to such schools as compared with the previous years. The students who left the school as such drop out the entire school system. Or else, they admit to famous big schools where large number of students are available. Consequently, the small schools which are the single avenue of moving into the common world by those who are living in difficult and underprivileged areas, bring to a closure and therefore, socio-economic issues are emerged in such societies. Hence, it is vibrant to investigate into the current status of the small schools persisting in the school system and submit proposals based on the research findings in order to guarantee the longstanding survival of such schools. It could result in resolving the issue of shutting down schools due to non-availability of students.

Hence, the main objective of this documentary study is to further scrutinize the findings and recommendations submitted through research studies conducted in relation to small schools and to forward possible action to be taken as a resolution. The Qualitative Systematic Review approach has been exploited to conduct this study in order to achieve the said objective. Accordingly, ten different studies conducted under the themes such as qualitative development of small schools, management strategies for principals of small schools, small schools' improvement and experience of principals in developing small schools were examined. The research findings divulged from these studies were analyzed under the themes: development

strategies executed by principals of small schools in Sri Lanka, their experience, problems encountered by small schools and recommendations and proposals submitted in order to avert the closing up of small schools and to improve such schools. Under the theme of development strategies executed by principals of small schools, matters discussed were further analyzed in different angles such as stakeholder decision making and community participation, leadership of the principal, planning, provision of funds, attractive leadership, marketing strategies and resource management. The self-reflective practices applied by four principals of Su/Johanathan Kanishta Vidyalaya, B/ Walasbedda Vidyalaya, Tri/ Mahawelipura Vidyalaya and WP/Ho/Manakada Kanishta Vidyalaya to develop those small schools have also been analyzed. The issues related to administration, students, learning – teaching process, community and human and physical resources were further examined under the theme of problems encountered by small schools.

The recommendations and proposals made to avert the closure of small schools and improve such schools have been scrutinized based on the topics such as establishment of a separate unit for small schools in the Ministry of Education, leadership of the principal, specific training courses for teachers and principals, motivation, community participation, community development, supervision, facilitation and resourcing and, thereby come up with following recommendations.

1. Establishment of a **separate unit for small schools** in the Ministry of Education and formulation of a proper mechanism to ensure the smooth functioning of small schools.
2. **Re-naming** the term ‘small schools’ and making a suitable arrangement for an attitudinal change in the community on small schools.

3. Appointment of **talented and potential principals** in order to empower the small schools and encouragement of **innovative practices** in those schools.
4. Provision of **special trainings** to both teachers and principals with regard to exclusive teaching strategies such as activity-based teaching, multi-grade teaching and inclusive education.
5. Implementation of a **special programme to evaluate** the extra-ordinary contribution of teachers and principals of small schools and **to motivate** them.
6. Promotion of **parents' involvement** in educational matters of their children.
7. Setting up of a **formal arrangement** to encourage the daily presence of children to school and their learning process.
8. Implementation of **Local Wisdom Programmes** inclusive of regional industries and cultural elements in collaboration with sponsors in order to increase the community participation and student motivation.
9. Attracting the **parents' participation** for the development of the school.
10. Organization of **non-formal education programmes** for the community.
11. Establishment of an **Assisted Supervision Procedure** with the view to uplift the school in every aspect while recognizing the different potentials of the available staff.
12. Recognizing of **distinctive criteria for external evaluation** of small schools.
13. Deciding on the **essential resource requirement** for a school by using an objective method of measurement in order to achieve an optimal level of learning and **provision of resource requirements as per a priority list** prepared considering the presently existing requirements of schools.

# ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල වර්තමාන තත්ත්වය
# සහ
# එම පාසල් වැසී යාම වැළැක්වීමට
# ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනයක්

## 1.0 හැඳින්වීම

සමාජානුයෝජනය යනු පූර්ව පරම්පරා විසින් බාල පරම්පරාවට, සමාජයට වැදගත් වන සම්මත, සිරිත් විරිත් සහ මතවාද පවරා දීමේ ක්‍රියාවලියයි. පාසල යනු සමාජානුයෝජන ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සඳහා නිර්මාණය කරන ලද සමාජ ආයතනයකි. ශිෂ්‍යයින් පාසලේ ගත කරන කාලය හා පාසලේ සිදුවන ක්‍රියාකාරකම් අනුව, සමාජානුයෝජන කාරකයක් ලෙස පාසලේ ඇති වැදගත්කම වඩාත් හොඳින් පැහැදිලි කළ හැකි ය. පාසලේ කැපී පෙනෙන කාර්යය වන්නේ සමාජ සම්මත පිළිබඳ සිසුන් දැනුම්වත් කිරීම සහ සමාජයට ප්‍රතිලාභ සැලසීම සඳහා ආර්ථික වශයෙන් ඵලදායී වීමට ඔවුන්ට උපකාර වන දැනුම, කුසලතා හා ආකල්ප ලබා දීම ය (Little, 2014). එසේ ම සිසුහු අධ්‍යයන විෂයමාලාවෙන් ඉගෙන ගන්නවා පමණක් නො ව, ඔවුන්ගේ ගුරුවරුන් හා සම වයසේ මිතුරන් සමඟ සමාජගත වීමෙන් ද ප්‍රයෝජන ලබති (Little, 2014). වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් සංඛ්‍යාව 10,165කි (සංඛ්‍යාලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 2019). ඒ අතුරින් පාසල් 2,966ක් ශිෂ්‍ය සංඛ්‍යාව 100 නොඉක්මවන කුඩා පාසල් වන අතර එය දිවයිනේ සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 29.2%කි (ශිෂ්‍ය ජනගහනය 100 නොඉක්මවන පාසල් දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාප්තව ඇති ආකාරය ඇමුණුම 1හි දක්වා ඇත). 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පාසල් 45ක් වැසී ගොස් ඇත. පළාත් අනුව එම පාසල් සංඛ්‍යාව සහ ඒවා වැසී යාමට බලපෑ හේතු වගු අංක 1න් නිරූපණය වේ.

**වගු අංක 1.**

**පාසල් වැසී යාමට බලපෑ හේතු අනුව පාසල් සංඛ්‍යාව (2014-2018)**

| **පළාත** | **වැසී යාමට බලපෑ හේතු අනුව පාසල් සංඛ්‍යාව** | | | | | **වැසී ගිය මුළු පාසල් සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|---|
| | **සිසුන් නොමැති වීම** | **නාය යාම** | **සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම** | **වෙනත් පාසල් සමග ඒකාබද්ධ කිරීම** | **වෙනත් හේතු** | |
| **බස්නාහිර** | 2 | 1 | | 2 | | 5 |
| **මධ්‍යම** | 2 | 1 | 2 | | | 5 |
| **දකුණ** | 1 | 1 | | | | 2 |
| **උතුර** | 11 | | | | 5 | 16 |
| **නැගෙනහිර** | | | | | | 0 |
| **වයඹ** | | 1 | | | 1 | 2 |
| **උතුරු මැද** | 3 | | | | | 3 |
| **ඌව** | 3 | | | | | 3 |
| **සබරගමුව** | 3 | | | | 6 | 9 |
| **එකතුව** | **25** | **4** | **2** | **2** | **12** | **45** |
| **%** | **55.6** | **8.9** | **4.4** | **4.4** | **26.7** | **100.0** |

(මූලාශ්‍රය. - සංඛ්‍යාලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 2018)

1 වන වගුවේ දත්ත විශ්ලේෂණය අනුව, වැසී ගිය පාසල් 45න් 25ක් (55.6%ක්) වැසී ඇත්තේ සිසුන් නොමැති වීම හේතුවෙනි. මෙම තත්ත්වය උද්ගත වීමට හේතු වන්නේ අඩු සිසුන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන කුඩා පාසල්වල සිසුන් ඉවත් ව යාම හෝ එම පාසල්වලට පසුගිය වර්ෂවලට වඩා අඩු සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් වීම යි. මෙසේ ඉවත් ව යන සිසුන් පාසල් පද්ධතියෙන් ඇද හැලීම හෝ වැඩි සිසුන් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන විශාල පාසල්වලට ඇතුළත් වීම හෝ සිදු විය හැකි ය. සිසුන් 45,000කට වැඩි ප්‍රමාණයක් 2009 දී පාසල් අධ්‍යාපනයෙන් ඇද හැලී ඇති අතර එය වැව්ලිකරයේ වසරකට 20%ක් තරම් ඉහළ අගයක් ගන්නා බවත් පිරිමි ළමයින්ගේ ඇද හැලීමේ අනුපාතය ගැහැනු ළමයින්ට වඩා ඉහළ අගයක් ගන්නා බවත් Perera (2012) දක්වා ඇත. පහළ සමාජ පන්තියේ පවුල්වල අධ්‍යාපනය සඳහා පහසුකම් නොමැතිකම සහ සමාජ ආර්ථික ගැටලු ද බාධාවක් වී ඇති බව Perera (2012) වැඩිදුරටත් දක්වා ඇත.

තව ද ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය, විශාල ජනප්‍රිය සහ බලවත් පාසල් ලෙසත්, කුඩා පාසල් ලෙසත් දෙපැත්තට බෙදී යනු දක්නට ලැබේ (කුලරත්න, 2015). සමහර ජනප්‍රිය පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව දහස් ගණනින් වර්ධනය වී ඇති අතර ඒවා පාලනය කර ගත නො හැකි තත්ත්වයට පත් ව තිබේ. අනෙක් අතින් ගම්බද සහ අවාසිදායක ප්‍රදේශවල කුඩා පාසල් ක්‍රමයෙන් කුඩා වී වැසී යන තත්ත්වයට පත් වී ඇත (කුලරත්න, 2015). මෙය පාසල් ධ්‍රැවකරණය (Polarization) ලෙස හැඳින්වේ (කුලරත්න, 2015). මෙසේ පාසල් ධ්‍රැවකරණය හේතුවෙන් පාසල් පද්ධතියේ ක්‍රමික ව සිදුවන ශිෂ්‍ය සංඛ්‍යා විචලනය වගු අංක 2න් නිරූපණය වේ.

**වගු අංක 2.**

**ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් ප්‍රවර්ගවල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වනු ලබන ප්‍රතිශතවල විචලනය (2016- 2018)**

| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වර්ගය | 2016 වර්ෂය | | 2017 වර්ෂය | | 2018 වර්ෂය | |
|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍ය සංඛ්‍යාව | ශ්‍රී ලංකාවේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය | ශිෂ්‍ය සංඛ්‍යාව | ශ්‍රී ලංකාවේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය | ශිෂ්‍ය සංඛ්‍යාව | ශ්‍රී ලංකාවේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය |
| 1 - 100 | 156,814 | 3.8 | 160,288 | 3.8 | 157,824 | 3.7 |
| 101 - 2500 | 3,308,553 | 79.9 | 3,289,376 | 79.0 | 3,308,126 | 78.5 |
| 2,500ට වැඩි | 677,740 | 16.4 | 716,291 | 17.2 | 748,822 | 17.8 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | **4,143,107** | **100.0** | **4,165,955** | **100.0** | **4,214,772** | **100.0** |

(මූලාශ්‍රය. - සංඛ්‍යාලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 2018)

2වන වගුවේ දත්ත විශ්ලේෂණයේ දී, ශිෂ්‍ය ගහනය ක්‍රමික ව, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි විශාල පාසල් වෙත ඇදී යාමේ ප්‍රවණතාවක් ඇති බව පැහැදිලි වේ. එසේ ම අධ්‍යාපන යෙදවුම්කරණයේ සුලභ අයහපත් අත්දැකීමක් වී ඇත්තේ සම්පත් තිබෙන පාසල්වලට ම තව තවත් සම්පත් ලබා දීම සහ ඌන සම්පත් සහිත පාසල්වලට සම්පත් නො ලැබී යාම බවත්, මේ සාධකය පාසල් පද්ධතිය ද්වීකරණය වීමට

(Bipolarization) බෙහෙවින් බලපා ඇති බවත් ජාතික අධ්‍යාපනය ආයතනය (2009) දක්වා ඇත.

මේ සම්බන්ධ ව අදහස් දක්වා ඇති අධ්‍යාපන අමාත්‍යාංශය (2007) අනුව එවකට අධ්‍යාපනය සඳහා ප්‍රවේශ පහසුකම් සැපයෙන පාසල් 9727ක් ඇතත්, ඉන් සැලකිය යුතු සංඛ්‍යාවක් පවත්වා ගෙන යාමට අසීරු වන තරම් ප්‍රමාණයෙන් කුඩා වීම, එවකට උද්ගත වී ඇති බරපතළ ගැටලුවක් බවත් ඒ හා සමඟ ම මෙහෙයවීමට අපහසු වන තරම් ප්‍රමාණයෙන් අතිවිශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් සුළු ප්‍රමාණයක් ඇති බවත් දක්වා ඇත. ඇතැම් ගම්බද පෙදෙස්වල පැන නැගී ඇති අලුත් ම ප්‍රවණතාව වී ඇත්තේ, ගුණාත්මකභාවයෙන් යුත් කාර්යක්ෂම පාසලක් පවත්වා ගෙන යාමට රුකුලක් වන ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොසිටීම බව, අධ්‍යාපන අමාත්‍යාංශය (2007) වැඩිදුරටත් දක්වා ඇත. මේ සම්බන්ධ ව අවධානය යොමු කර ඇති සර්මා, ලයිච්ට් සහ කළුගලගෙදර (2018), ගුණාත්මක අධ්‍යාපන ප්‍රවේශය වෙත පවත්නා අසමාන අවස්ථා, ඉගෙනුම් ඵල අඩු වීමට හේතු වන බවත් ඉන් අවාසි අත්විඳින කණ්ඩායම්, සිය ජීවිතයේ පසු කාලයේ දී අවාසිදායක තත්ත්වවලට මුහුණ දෙන අතර, ශ්‍රම වෙළඳපොළෙහි දී අඩු ප්‍රතිලාභ අත්කර ගැනීම මගින් ප්‍රකාශයට පත් වන මෙම තත්ත්ව, සමාජ සචලතාව අඩු වීම නිසා තව දුරටත් ශක්තිමත් විය හැකි බවත් සඳහන් කර ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන කුඩා පාසල ක්‍රමික ව වැසී යාම හා බෙලහීන තත්ත්වයකට පත්වීම, වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාවකි (වාකිෂ්ඨ, 2014). පාසල් වැසී යාමට බලපෑ සාධක ලෙස විදුහල්පතිවරුන්ගේ දුර්වල කළමනාකරණය හා පරිපාලනය, නිලධාරීන්ගේ අවධානය අඩු වීම, හා දීර්ඝ කාලයක් තිස්සේ පැවතෙන ගුරු හිඟය, ග්‍රාමීය පාසල් පිළිබඳ ඉහළ නිලධාරීන්ගේ අවධානය අඩු වීම, කිලෝ මීටර 2-3ක් වැනි දුරකින් පාසල් 3-4ක් පිහිටීම, පාසල හා දෙමාපියන් අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාව අඩු මට්ටමක පැවතීම, දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන මට්ටම නිසා පාසල සමඟ

පවත්වන දූරස්ථ සම්බන්ධතාව හා දරුවන් පාසල වෙත යොමු කරන ලද දෙමාපියන්ගෙන් බහුතරය කම්කරු වෘත්තියෙහි යෙදෙන නිසා පාසල පිළිබඳ සොයා බැලීමට කාලය අඩුවීම යන සාධක, ප්‍රේමසිරි (2013) විසින් දක්වනු ලැබ ඇත. කුඩා පාසල් වැසී යෑමේ මෙම ප්‍රවණතාව දිගු කාලීන ව පැවතුන හොත් ග්‍රාමීය ජනතාවට මූලික අධ්‍යාපන පහසුකම් සලසා දෙන ආයතනයක් ග්‍රාමීය මට්ටමේ නොමැති වේ. මෙම තත්ත්වය හේතුවෙන් ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනයට මෙන් ම ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයට ද විශාල බලපෑමක් සිදු වේ (වාකිෂ්ඨ, 2014). ශ්‍රී ලංකාවේ සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ කුඩා පාසලට හිමි නිසි වැදගත්කම ලැබී නොමැති බවත් රටේ කුඩා පාසල් පද්ධතිය නිසි පෝෂණයක් නොලද වෘක්ෂයන් මෙන් නිසරු වූ හා ගරා වැටුණ තත්ත්වයට පත්ව ඇති බවත් මෙන්ඩිස් (1990) පෙන්වා දී තිබේ.

එසේ ම ශ්‍රී ලංකාවේ කුඩා පාසල් ආශ්‍රිත කළමනාකරණ ගැටලු ඒකනායක සහ සෙසු අය (2012) විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. *" දුෂ්කර ප්‍රදේශවල වඩාත් ව්‍යාප්ත ව ඇති කුඩා පාසල් සම්පත් හිඟකම, ඉගෙනුම් දුර්වලතා, සාධන මට්ටම අඩුවීම, අඩු පෙලඹවීම, ආදර්ශ අඩු වීම හා අවස්ථා අඩු වීම යන අවාසිදායක තත්වයන් හා නිරන්තර ව බැඳී පවතී. අවට සමාජයේ ද පවතින්නේ දරිද්‍රතාව පෙරටු කොට ඇත්තා වූ විවිධ ප්‍රශ්න සමූහයකි. සමාජ අසාධාරණකම්වලට ද මොවුන් ලක් වන්නාහු ය"* (p. 6).

සිසුන් අඩු සංඛ්‍යාවක් සහිත කුඩා පාසල් පවත්වා ගෙන යාම ආර්ථික වශයෙන් ඵලදායක නො වන බවට අදහස් ඉස්මතු වී ඇත (NEC, 2003). විශේෂයෙන් ම ගම්බද පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු නිසා ගොඩනැගිලිවල ඌන භාවිතයක් ඇති බව ජාතික අධ්‍යාපන ආයතනය (2009) දක්වා ඇති අතර, සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම සඳහා පිළිගත් ගුරු සිසු අනුපාතය වන්නේ 1:25ක් වුවත් අධ්‍යයනයට ලක් කළ කුඩා පාසල්වල 1:2 සිට 1:14 දක්වා වූ ගුරු සිසු අනුපාතයක් ඇති බව දමයන්ති (2012)

වාර්තා කර ඇත. මෙලෙස භෞතික සහ මානව සම්පත්වල ඌන භාවිතයක් පැවතීම අධ්‍යාපන නාස්තියක් (Education wastage) ලෙස දැක්විය හැකි ය. මෙම තත්ත්වයට මුහුණ දීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය, 1996 වර්ෂයේ දී පාසල් ජාලය විචාරවත් කිරීමේ වැඩසටහනක් (Programme of rationalisation of school network) හඳුන්වා දී ඇත (අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 1996/37 සහ 1996-11-18 දින). විශේෂයෙන් ම 1980 දශකයේ සිට ක්‍රියාත්මක වූ සමාජ වියදම් සහ රාජ්‍ය අංශය පාලනය කිරීමේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත (NEC, 2003). මෙ මගින් අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින උසස් පෙළ පන්ති සහිත 1AB සහ 1C වර්ගවල පාසල්, කුඩා ද්විතීයික අංශ සහිත 2 වර්ගයේ පාසල් සහ කිලෝ මීටර් දෙකක අරය ඇතුළත වෙනත් පාසලක් පිහිටා ඇති කුඩා ප්‍රාථමික පාසල් විචාරවත් කරන ලෙස, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ට සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබා දී ඇත. මේ උපදෙස් යටතේ, වසා දමන පාසල්වල ගොඩනැගිලි සහ ඉඩම් යොදා ගත යුතු වන්නේ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්, සාක්ෂරතා සහ ප්‍රජා මධ්‍යස්ථාන සඳහා ය. මෙම වැඩසටහන යටතේ පාසල් පද්ධතිය විචාරවත් කිරීමට සැලසුම් සකස් කිරීමටත් කිලෝමීටර් දෙකක් ඇතුළත පාසල්වලට සිසුන් අඩු සංඛ්‍යාවක් ඇතුළත් කර ගන්නා ප්‍රාථමික පාසල් ආසන්න ප්‍රාථමික පාසල් සමඟ ඒකාබද්ධ කිරීමට සහ කිලෝමීටර හතරක් ඇතුළත පිහිටි සිසුන් අඩු සංඛ්‍යාවක් ඇතුළත් වන ද්විතීයික ශ්‍රේණි සහිත ආසන්න පාසල් සමඟ ඒකාබද්ධ කිරීමටත් පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදි (අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 3PPR/PP/GA/102 සහ 30/1/1999). මේ හේතුවෙන් අඩු සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් වූ කුඩා පාසල්, ආර්ථික ව ඵලදායී නොවන ආයතන යැයි අනුමාන කර, වසා දැමීමේ වේගය වැඩි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, පාසල් 500ක් පමණ ඒකාබද්ධ කර හෝ වසා දමා හෝ ඇති බව වාර්තා වේ (NEC, 2003). කෙසේ වෙතත්, මෙම ක්‍රියාමාර්ග හේතුවෙන්, විශේෂයෙන් ම ගම්බද පාසල්වලට

ඇතුළත් ව සිටි අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින් පාසල්වලට ඇතුළත් නො වීමේ සහ පාසල්වලින් ඇදහැලීමේ ප්‍රවණතාවකට මග පෑදුණි. මේ ආකාරයට පාසල් වසා දැමීම නිසා එම පාසල්වල පැවති භෞතික පහසුකම් අපතේ යාම සහ විශාල පාසල්වල පන්තිවල ශිෂ්‍ය ප්‍රමාණය වැඩිවීමට හේතු වී ඇති බවට ද පසු ව විවේචන එල්ල වී ඇත (NEC, 2003). සම්පත් නාස්තිය වැළැක්වීමේ පියවරක් ලෙස කුඩා පාසල් වසා දැමුව ද, මේ හේතුවෙන් දුගී ජනතාවගේ අධ්‍යාපන අපේක්ෂා සහ අවස්ථාවලට සෘණාත්මක බලපෑමක් ඇති වී තිබෙන බව ද NEC (2003) වැඩි දුරටත් පෙන්වා දී ඇත.

පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් කරනු ලබන වර්ගීකරණයක් අනුව ශිෂ්‍ය සංඛ්‍යාව 100ට අඩු පාසල් කුඩා පාසල් ය (ඒකනායක සහ සෙසු අය, 2012). සිසුන් සංඛ්‍යාව 100ට අඩු පාසල් පළාත් අනුව ව්‍යාප්ත වී අන්දම වගු අංක 3න් නිරූපණය වේ.

**වගු අංක 3.**
**සිසුන් 100ට අඩු පාසල් පළාත් අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය (2016-2018)**

| පළාත | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සිසුන් 100 ට අඩු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය | සිසුන් 100 ට අඩු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය | සිසුන් 100 ට අඩු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය |
| බස්නාහිර | 201 | 1,360 | 14.8 | 201 | 1,359 | 14.8 | 206 | 1,356 | 15.2 |
| මධ්‍යම | 494 | 1,521 | 32.5 | 503 | 1,519 | 33.1 | 485 | 1,517 | 32.0 |
| දකුණ | 302 | 1,114 | 27.1 | 291 | 1,112 | 26.2 | 285 | 1,110 | 25.7 |
| උතුර | 411 | 971 | 42.3 | 443 | 997 | 44.4 | 449 | 987 | 45.5 |
| නැගෙනහිර | 309 | 1,106 | 27.9 | 324 | 1,110 | 29.2 | 327 | 1,114 | 29.4 |
| වයඹ | 327 | 1,259 | 26.0 | 323 | 1,256 | 25.7 | 313 | 1,250 | 25.0 |
| උතුරු මැද | 256 | 805 | 31.8 | 254 | 812 | 31.3 | 250 | 815 | 30.7 |
| ඌව | 285 | 895 | 31.8 | 301 | 900 | 33.4 | 299 | 898 | 33.3 |
| සබරගමුව | 413 | 1,131 | 36.5 | 406 | 1,129 | 36.0 | 396 | 1,128 | 35.1 |
| **එකතුව** | **299** | **10,162** | **29.5** | **3046** | **10,194** | **29.9** | **3010** | **10,175** | **29.6** |

(මූලාශ්‍රය. - සංඛ්‍යාලේඛන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, 2019)

වගු අංක 3 අනුව පෙනී යන්නේ, සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ මුළු පාසල් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්න සංඛ්‍යාවක් කුඩා පාසල් ලෙස පවතින බව යි. එසේ ම උතුරු පළාතේ පාසල්වලින් 45%කට ආසන්න ප්‍රමාණයක් සිසුන් 100ට අඩු කුඩා පාසල් වීම ද අවධානයට යොමු විය යුතු විශේෂ කරුණක් වේ.

කුඩා පාසල් ලෝකය පුරා විවිධ රටවල ව්‍යාප්ත වී ඇති බවත්, ඒ සම්බන්ධ ව දෙයාකාරයක මතධාරීන් සිටින බවත් Bray (2007) දක්වා ඇත. ඉන් එක් කොටසක් දැඩි ව තර්ක කර සිටින්නේ කුඩා පාසල් යනු පෞද්ගලික වාතාවරණයක් (personal atmosphere) සහිත ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන බවයි. ඔවුන් පවතින කුඩා පාසල් ආරක්ෂා කිරීමටත් නව කුඩා පාසල් විවෘත කිරීමටත් අපේක්ෂා කරන බව දක්වා ඇත. අනෙක් පිරිස තර්කකරනු ලබන්නේ කුඩා පාසල් ඉහළ ඒකක පිරිවැය (unit costs) සහිත බවත්, ඉන් සීමිත පරාසයක විෂයමාලාවක් (restricted curriculum) පමණක් ලබා දිය හැකි බවත් ය. එබැවින් එම පිරිස පවත්නා කුඩා පාසල් වසා දැමීමටත්, අලුතෙන් කුඩා පාසල් බිහි වීම වැළැක්වීමටත් අපේක්ෂා කරන බව දක්වා ඇත. කෙසේ වුව ද මෙම මත දෙකට ම යම් වලංගුභාවයක් ඇති බවත්, එම හේතුවෙන් අධ්‍යාපන පරිපාලකයන්ට මේ සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයට අසීරු වී ඇති බවත් Bray (2007) වැඩි දුරටත් දක්වා ඇත.

ලෝකයේ විවිධ ආණ්ඩුවල අවශ්‍යතාව වී ඇත්තේ අවම සම්පත් පිරිවැයකින් උපරිම අධ්‍යාපනික සහ සමාජ ප්‍රතිලාභ ලබා ගැනීමයි. මේ නිසා කුඩා පාසල් සම්බන්ධ ව රජය අනුගමනය කරනු ලබන ක්‍රියාකලාපවල, රටවල් අභ්‍යන්තරයේ මෙන් ම රටවල් අතර ද පුළුල් විචලන පවතින බව Bray (2007) දක්වා ඇත. මීට හේතු වී ඇත්තේ අධ්‍යාපන බලධාරීන් විසින් කුඩා පාසල්වල ප්‍රබලතා සහ දුබලතා කිරා මැන බැලීමට පෙලඹීමයි. එබැවින් කුඩා පාසල් ඇතැම් වාතාවරණයක දී පිළිතුරක් වුවත් වෙනත් වාතාවරණයක දී එය එසේ නොවිය හැකි ය. කෙසේ වුව ද, Bray (2007) අනුව පාසලකට

සිසුන් ඇතුළත් වීම පහළ වැටුණු වහා ම එම පාසල වසා දැමීම අනුචිත වන්නේ, ඉදිරි වර්ෂවල දී එම පාසලේ ඇතුළත් වීම් නැවත වරක් ඉහළ යා හැකි බැවිනි. එසේ ම පාසලක් වැසී යාමේ ඉඟි පවතින විට දෙමාපියෝ තම දරුවන් එම පාසලට ඇතුළත් කිරීමට මැලිකමක් දක්වති. අනාගතයේ දී එම පාසල වැසී ගියහොත් තම දරුවන්ගේ අනාගතය අඳුරු වේ යයි බියක් පැවතිය හැකි ය. මේ නිසා එම පාසල්වල ඇතුළත් වීම් පහළ යා හැකි ය. නමුත් ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන ලෙස කුඩා පාසල් වැදගත් වන හෙයින් ඒවාට අනෙකුත් පාසල්වලට වඩා වැඩි ඒකක පිරිවැයක් දැරීමට සිදු වුව ද එය සාධාරණීකරණය කළ හැකි ආයෝජනයක් (justifiable investment) ලෙස Bray (2007) වැඩි දුරටත් දක්වා ඇත. කුඩා පාසල් සිසුන්ගේ පදිංචි නිවාසවලට ආසන්න ව පිහිටි නිසා සිසුන්ගේ ප්‍රවාහන වියදම් අවම වීම මෙන් ම සිසුන්ට ගමන් විඩාවක් ඇති නොවීම ද වාසි සහගත තත්ත්වයක් බව දක්වා ඇත. එසේ ම කුඩා පාසල් තුළ වඩාත් කුළුපග සහ සහයෝගී වාතාවරණයක් පවතින බව ද Bray (2007) පෙන්වා දී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය (2007) දක්වන පරිදි පාසල් පද්ධතියේ ඉතා කුඩා ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල් සහ ඉතා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල් යනුවෙන් පාසල් අතර පවත්නා ද්විවිධ සීමාන්තිකරණය වඩ වඩාත් තීව්‍ර වීමේ ප්‍රවණතාව හේතුවෙන්, වඩාත් විශාල පාසල්වල සහ තරමක් කුඩා ප්‍රමාණයේ පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක බව කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල වී තිබේ. එසේ ම පවත්නා යථාර්ථය වී ඇත්තේ වාර්තාවල ප්‍රමාණයටත් වඩා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් පාසල්වල සිටීම බව ද ශිෂ්‍ය සංඛ්‍යාව 15ටත් වඩා අඩු බොහෝ පාසල්වල ගුරුවරුන් දෙදෙනකු හෝ තිදෙනකු සේවය කරන බව ද අධ්‍යාපන අමාත්‍යාංශය (2007) වැඩිදුරටත් දක්වා ඇත. මේ නිසා පාසල් පද්ධතිය විචාරවත් කිරීම සහ කුඩා පාසල් පිළිබඳ ව අධ්‍යාපන අමාත්‍යාංශය (2007) පහත අදහස් ඉදිරිපත් කර ඇත.

*"මෙම තත්ත්වය නිවැරදි කිරීම හේතූන් දෙකක් නිසා වැදගත් වේ. ඉන් පළමුවැන්න ශිෂ්‍ය සංඛ්‍යාව 50කටත් වඩා අඩු පාසල් ප්‍රමාණාත්මක වශයෙන් ඉතා කුඩා වන බැවින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ඒවා සුදුසු තත්ත්වයක නොපැවතීමයි. එවැනි පාසල් කෙරෙහි දක්ෂ ගුරුවරුන් ආකර්ෂණය නොවනු ඇත. ළමයාගේ පූර්ණ සංවර්ධනයක් ඇති කිරීමට එබඳු වාතාවරණයක් කිසිසේත්ම හිතකර නොවේ. මෙම පාසල්වල ගුරු අභිප්‍රේරණය ද සාමාන්‍යයෙන් පහළ මට්ටමක පවතී. ඌන වරප්‍රසාද සහිත පවුල් පසුබිමකින් පැමිණෙන ළමයින් හට හිතකර සමාජමය සහ චිත්තවේගී සංවර්ධනයක් ලබා දීමට තරම් ආදර්ශවත් පරිසරයක් නොමැත. ඔවුන් හට සම වියේ ළමයින් හා එක් ව ඉගෙනීමට ඇති අවස්ථා ද බෙහෙවින් සීමිත ය. පර්යේෂණ මගින් පෙන්වා දී ඇති පරිදි ළමයින් වැඩි වශයෙන් සමාජානුගත වෙමින් සමාජමය හා භාවාත්මක අගයන් උකහා ගනුයේ ඔවුන්ගේ මුල් වසර 12 ඇතුළත දී ය. දෙවැනි හේතුව වශයෙන් පෙන්වා දිය හැක්කේ මෙම පාසල් පවත්වා ගෙන යාම ආර්ථික වශයෙන් බෙහෙවින් අවාසිදායක වීම යි. ගුරුවරුන් යෙදවීමේදීත් සම්පත් වෙන්කර දීමේදීත් අමතර වශයෙන් අධික නාස්තියක් සිදුවේ. මෙම කුඩා පාසල්වල ඒක ශිෂ්‍ය පිරිවැය ද පමණට වඩා ඉහළ මට්ටමක පවතී. තත්ත්වය එසේ වුවත් රටෙහි කුඩා ම පාසල් මගින් ආර්ථික වශයෙන් අඩුම වරප්‍රසාද හිමි ජන කොටස්වලට සේවයක් සැලසෙන බව ඉඳුරා ම පිළිගත යුතු සත්‍යයකි. මෙම පවුල්වලට අයත් වන ළමයින් තුළ ඉතා සුළු ගැටුම්කාරී තත්ත්වයක් තුළ වුව ද පාසල් හැර යාමට පහසුවෙන් පෙලඹෙන ස්වභාවයක් දක්නට ඇත. එහෙයින් මේ සම්බන්ධයෙන් ගත යුතු ප්‍රථම ක්‍රියාමාර්ගය වන්නේ සිසුන් ආකර්ශනය කර ගැනීමට හැකිවන අයුරින් මෙම පාසල් නම්‍යතාවෙන් යුතු සජීවී මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම යි. සෙසු පාසල්වලට බලපාන පොදු නීති රීති පද්ධතිය සහ ආර්ථික සීමා මායිම් එපරිද්දෙන් ම මෙම පාසල්වලට අදාළ කර ගැනීම අසීරු කරුණක් විය හැකි ය."* (පිටුව 41-42).

දුෂ්කර අවාසිදායක පරිසරවල වෙසෙන ජනතාවට පුළුල් ලෝකයට අවතීර්ණ වීමට ඇති එක ම පිටිවහල මෙම කුඩා පාසල් ම පමණක් බවත් පුළුල් වශයෙන් ගත් කල, කුඩා පාසල ග්‍රාමීය ප්‍රජාවගේ දියුණුව උදෙසා ක්‍රියා කළ යුතු යැයි ද, අධ්‍යාපනික වශයෙන් ගත් කල, ග්‍රාමීය දරුවන්ට උදවු කළ යුතු යැයි ද, අපේක්ෂා කරන බවත් කුඩා පාසලේ සේවය කරන සම්පත් පුද්ගලයන්, අධ්‍යාපනයට අමතර ව, ප්‍රජාවට නොයෙකුත් සේවා සපයන බවත් ඒකනායක සහ සෙසු අය (2012) දක්වා ඇත. කුඩා පාසල් සේවය කරන්නේ දුප්පත් පන්තියේ දරුවන්ට ය. අධ්‍යාපනය සමාජ අසාධාරණය තීව්‍ර කරන ආයුධයක් බවට පත් ව තිබේ. මේ නිසා කුඩා පාසල් සංවර්ධන කිරීමේ වැඩ පිළිවෙළක් වහා ම ආරම්භ කළ යුතු යයි කුලරත්න (2015) දක්වා ඇත. එසේ ම යහ පාලනයේ දී අවදානමට පාත්‍ර වූ කණ්ඩායම් (Vulnerable groups) සඳහා සේවා සැපයීම අත්හළ නො හැකි බැවින් අවාසිදායක සමාජ ආර්ථික ප්‍රදේශවල ළමයින් සඳහා සේවය සපයන කුඩා පාසල් සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව UNESCO (2008) වාර්තාව මගින් ද නිර්දේශ කර ඇත.

ඒකනායක සහ සෙසු අය (2012) කුඩා පාසල් සම්බන්ධ ව පහත අදහස් දක්වා ඇත.

***"පාසල් සංඛ්‍යාව, ඒවායේ හැසිරීම, ශිෂ්‍ය සංඛ්‍යාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව, සම්පත් ලැබීම, ප්‍රජා සහභාගිත්වය, යන කුඩා පාසල් සම්බන්ධ දත්ත පිළිබඳ ව ක්‍රමවත් ව සහ විධිමත් ව තක්සේරුකරණයක් හෝ තේරුම් ගැනීමක් දශක කීපයක් පුරා අධිකාරීන් මගින් සිදු වී නැත. කුඩා පාසල්වල ස්වභාවය සැලකීමේ දී ඒවාට ඉතා සුවිශේෂී වූ සැලකිල්ලක් අවශ්‍ය වේ. මෙම පාසල්වලට ධනාත්මක ව සැලකීමක් ද ප්‍රතිපත්තිමය වශයෙන් ද දක්නට නො ලැබේ. ඒ නිසා මේ කුඩා පාසල් හඬක් නො නගා, ගෞරවයක් නො ලබා දිනෙන් දින ක්‍රම ක්‍රමයෙන් අභාවයට යන ස්වරූපයක් ගනී. වර්ෂ 1970 දී ආරම්භ වූ කුඩා පාසල් ව්‍යාපෘතිය මෙම අසමතා නවතාලීමට සමත් නො වී ය. මෙම ව්‍යාපෘතියේ***

*අභිප්‍රාය ඉතා උසස් වුව ද, අගය කළ යුතු වුව ද, එළැඹුම් සම්ප්‍රදායක සහ ඇල්මැරුණු තත්ත්වයේ ඒවා විය. ප්‍රතිපාදන අවසන් වූ වහා ම ක්‍රියාවලිය ද අවසන් විය"* (පිටුව ii).

එසේ ම මේ පිළිබඳ වඩාත් විස්තීර්ණ ලෙස අදහස් දක්වා ඇති සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009) පහත කරුණු ඉදිරිපත් කර ඇත.

*"දැනට කුඩා පාසලක අර්ථ දැක්වීමට පදනම් කර ගෙන ඇති මිණුම් දණ්ඩ, තත් පාසලට ඇතුළත් වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ය. මේ මිණුම් දණ්ඩ අනුව ශිෂ්‍යයන් 100 කට අඩු සංඛ්‍යාවක් සිටින පාසලක් කුඩා පාසලක් වශයෙන් සලකනු ලැබේ.*

*1996 හි 'පාසල් පද්ධතිය විචාරවත් කිරීමේ' වැඩසටහන යටතේ කුඩා පාසල් 356ක් පවත්වා ගැනීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේ යැයි සැලකුණු නිසා ඒවා වසා දැමීමට තීරණය විය.*

*පාසල් වසා දැමීම සඳහා යොදාගන්නා ලද ප්‍රධාන මිනුම් දඬු දෙකක් වූයේ,*

*(i) අවම ඇතුළත් කර ගැනීම් සංඛ්‍යාව හා*

*(ii) නියමිත දුරක් ඇතුළත පාසල් අධ්‍යාපන පහසුකම් තිබීම*

*යන කරුණු ය.*

*මෙසේ වසා දමන ලද පාසල්වලින් 80%ක පමණ පැවති ලක්ෂණයක් වූයේ ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම අඩු වීම යි. මේ පාසල්වල ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම අඩු වීමට ප්‍රධාන හේතු කිහිපයක් පර්යේෂණ අධ්‍යයනවලින් අනාවරණය වී ඇත. ඒවා මෙසේ යි.*

*(i) දරුවා ජීවත් වන පරිසරයෙහි 'හොඳ පාසල්' පැවතීම හා තමන්ගේ පවුලේ ආදායම් තත්ත්වය අනුව ඒ පාසල්වලට තම දරුවන් යැවීමට දෙමාපියන් තුළ පැවති අපේක්ෂාවන්*

*(ii) අ. මේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන්ගේ දුර්වල කළමනාකරණය සහ ගුණාත්මක බවින් අඩු දුර්වල ඉගැන්වීම*

*ආ. කුඩා පාසල්වල ළමයින්ගේ සාධනය හා ප්‍රවර්ධනය කෙරෙහි අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන් සහ ප්‍රජා නායකයන් දක්වන නොසැලකිල්ල සහ ඒ අනුව ළමයින්ට දෙනු ලබන අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය පිරිහී යාම."* (p. 37 - 38)

කුඩා පාසල්වල පවත්නා තත්ත්වය පිළිබඳ අදහස් දක්වන සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009), මේ පාසල් ප්‍රධාන වශයෙන් තම සේවාව සලසන්නේ දිළින්දන් අතුරෙන් දිළිඳු ම දෙමාපියන්ගේ දරුවන්ට බවත් ඔවුහු නොසලකා හැර ඇති අමතක කර දමා ඇති අය බවත් මෙම පාසල්වල දෙමාපියන් ඉල්ලීම් කරන්නේ අඩුවෙන් බවත් තමන්ට ලැබෙන දෙයක් භාර ගැනීමට ඔවුහූ හුරු වී සිටින බවත් දක්වා ඇත. එසේ ම මේ පාසල්වල සම්පත් ප්‍රමාණවත් නැතිකමෙන් පෙන්නුම් කරන්නේ ඒවා අත්හැර දමා තිබීමත් ඒවා ගැන සැලකිල්ලක් නොදැක්වීමත් බව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009) තව දුරටත් පෙන්වා දී ඇත.

මෙම පාසල් සංවර්ධනය කිරීමේ දී කුඩා පාසල්වල හුදෙකලා ස්වභාවය, කෙරෙන යහපත් කටයුතු අගය කිරීම ප්‍රමාණවත් නොවීම සහ අධීක්ෂක හා උපදේශක සහායක් නැතිකම විසඳිය යුතු ව ඇති ප්‍රශ්න බවත් කුඩා පාසල් සමාලෝචනය කළ යුත්තේ ඒවායේ පිහිටීම හා ගැටලුවේ ස්වභාවය සැලකිල්ලට ගැනීමෙන් බවත් ගැටලුවේ බහුවිධ ස්වභාවය නිසා බහුවිධ ප්‍රවේශ අවශ්‍ය බවත් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009) දක්වා ඇත. මේ නිසා සැබෑ අවශ්‍යතාවක් ඇති තන් හී කුඩා පාසල් දිගට ම තිබෙන්නට හැරීමේ අවශ්‍යතාව පිළිගැනීමෙන් ද, ඒ අතර ම යටත් පිරිසෙයින් සාධාරණ දුරක් ඇතුළත ඉගෙනීමේ පහසුකම් ඇති ප්‍රදේශවල පාසල් යාවත්කාලීන කිරීම සිසුන් ගිලිහී යාමට තුඩු දෙනු ඇතැයි උපකල්පනය කිරීමෙන් ද, කිසියම් ප්‍රමාණයක යාවත්කාලීන කිරීමක් සපුරා ගත හැකි වනු ඇති බව ද

උක්ත කමිටුව දක්වා ඇත. එසේ ම අධ්‍යාපනයේ ආංශික සංවර්ධන වැඩසටහන (අධ්‍යාපන අමාත්‍යාංශය, 2007) කුඩා පාසල් නිසා සිදුවන නාස්තිය විශ්ලේෂණය කර දක්වා ඇති බවත් පාසල් සංගණනයට අනුව, 1:04 ගුරු ශිෂ්‍ය අනුපාතයක් සහිත ශිෂ්‍යයන් 15ට අඩු පාසල් 258ක් ද, 1:07 අනුපාතයක් සහිත ශිෂ්‍යයන් 25ට අඩු පාසල් 717ක් ද, 1:11 අනුපාතයක් සහිත ශිෂ්‍යයන් 50ට අඩු පාසල් 1525ක් ද, එවකට පැවති බවත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වූ විට එබඳු පාසල්වල දෙනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ද අඩු බව සැලකිල්ලට ගත යුතු බවත් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009) දක්වා ඇත. එසේ වුව ද කුඩා පාසල්වල දීර්ඝ කාලීන පැවැත්ම පිළිගෙන ඇති උක්ත කමිටුව, මේ තත්ත්වයට මුහුණ දීම සඳහා, භූගෝලීය පිහිටීම අනුව පාසල්, පාසල් පවුලක් වශයෙන් සමූහගත කිරීමේ ක්‍රමයක් ගැන ගවේෂණය කර බැලිය යුතු බව යෝජනා කර ඇත.

එබැවින් පාසල් පද්ධතියේ කුඩා පාසල්වල දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීම පිණිස පර්යේෂණ අනාවරණ පදනම් කර ගෙන යෝජනාවලියක් ඉදිරිපත් කිරීම කාලීන ව වැදගත් ය. එමගින් සිසුන් නොමැති වීම නිසා පාසල් වැසී යාමේ ගැටලුව ද විසඳීමට හැකි වනු ඇත. මේ සඳහා කුඩා පාසල් ආශ්‍රිත ව සිදු කරනු ලැබූ පර්යේෂණවලින් ඉදිරිපත් කර ඇති අනාවරණ සහ නිර්දේශ අධ්‍යයනය කර ඒ සඳහා ගත යුතු පියවර ඉදිරිපත් කිරීම මෙම ලේඛන අධ්‍යයනයේ අරමුණ වේ.

## 2.0 අධ්‍යයනයේ අරමුණු

1. ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සම්බන්ධ ව සිදු කර ඇති අධ්‍යයන පාදක කොට විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග, අත්දැකීම් සහ ඒවා මුහුණ පා ඇති ගැටලු ඇසුරෙන් එම පාසල්වල පැවැත්ම පිළිබඳ තත්ත්වය අනාවරණය කිරීම
2. කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නගා සිටුවීම පිණිස එම අධ්‍යයනවලින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා විමර්ශනය කිරීම

## 3.0 අධ්‍යයන ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබුවේ ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය (Qualitative systematic review) යි. ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය යනු කිසියම් මාතෘකාවක් පිළිබඳ ව පවත්නා සාහිත්‍ය පරිපූර්ණ ව, සවිස්තරාත්මක ව සහ ගුණාත්මක ව සමාලෝචනයට භාජනය කිරීම යි. හොඳ ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයකින් පර්යේෂණාත්මක සාක්ෂ්‍ය එකට කැටි කිරීමෙන්, අදාළ ක්ෂෙත්‍රයේ ව්‍යවහාර සහ කාර්ය තේරුම් ගැනීමට උපකාර වේ (Seers, 2015). ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයකින් සිදුවීම්වලට හේතු සොයා ගැනීමෙන් අවබෝධය පුළුල් කර ගත හැකි ය. ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනය වඩා මෑතක දී සංවර්ධනය කරනු ලැබූ ක්‍රමවේදයක් වන අතර තවමත් විකාශනය වෙමින් පවතී (Seers, 2015). ගුණාත්මක ක්‍රමානුකූල සමාලෝචනයේ පියවර හතක් Galdas, Darwin, & Fell et al. (2015) ඉදිරිපත් කර ඇත. ඉන් පළමු පියවර වන්නේ ආරම්භ කිරීම යි. මෙයට, අදාළ පර්යේෂණ ප්‍රශ්න හඳුනා ගැනීම සහ ප්‍රොටෝකෝලය (Protocol) සංවර්ධනය අයත් වේ. දෙවන පියවරේ දී අදාළ වන්නේ මොනවා දැයි තීරණය කළ යුතු ය. මෙයට සෙවුම් ක්‍රමෝපාය (Search strategy), ඇතුළත් කිරීමේ නිර්ණායක (Inclusion criteria), තත්ත්ව ඇගයීම (Quality appraisal) සහ සෙවුම් ප්‍රතිඵල (Search outcome) යන කරුණු ගැන

තීරණය කිරීම අයත් වේ. අවසන් පියවර පහේ දී, දත්ත උපුටා ගැනීම සහ දත්ත විශ්ලේෂණය සිදු වේ. ඒ අනුව තෙවැනි පියවර වන්නේ අධ්‍යයන වාර්තා කියවීම යි. සිවුවන පියවරේ දී එම අධ්‍යයන වාර්තාවල පවතින අන්‍යෝන්‍ය සබඳතා තීරණය කළ යුතු ය. පස්වන පියවරේ දී එම අධ්‍යයන වාර්තා එකිනෙක ගළපා ගත යුතු ය. හයවන පියවරේ දී ඒවා සංස්ලේෂණයට භාජනය කළ යුතු ය. හත්වන පියවරේ දී එම සංස්ලේෂණ විස්තර කළ යුතු ය (Galdas, Darwin, & Fell et al., 2015). මේ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණාත්මක සාක්ෂ්‍ය ගවේෂණය, හඳුනා ගැනීම, තෝරා ගැනීම, ඇගයීම සහ සංස්ලේෂණය යන මූලික කාර්ය ඉටු කරන ලදි. මෙහි දී අධ්‍යයනයේ අරමුණු තීරණය කිරීම, අධ්‍යයනය සඳහා ඇතුළත් කරන (Inclusion) සහ බැහැර කරන (Exclusion) නිර්ණායක තීරණය කිරීම, ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය ඇසුරින් අදාළ සාහිත්‍ය හඳුනා ගැනීම, එම අධ්‍යයනවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම, අධ්‍යයනවලින් අදාළ පර්යේෂණාත්මක දත්ත උකහා ගැනීම, දත්ත විශ්ලේෂණය, ප්‍රතිඵල සමාලෝචනයට භාජනය කර නිගමනවලට එළැඹීම හා යෝජනා ඉදිරිපත් කිරීම යන පියවර අනුගමනය ලදි.

## 4.0 පර්යේෂණාශ්‍රිත ලේඛන විමර්ශනය

මෙම මාතෘකාව සම්බන්ධ ව හඳුනා ගන්නා ලද තේමා වන කුඩා පාසල්වල ගුණාත්මක සංවර්ධනය, කුඩා පාසල් විදුහල්පති කළමනාකරණ උපායමාර්ග, කුඩා පාසල් නඟා සිටුවීම සහ කුඩා පාසල් සංවර්ධනය කිරීමේ විදුහල්පති අත්දැකීම් යන තේමා යටතේ සිදු කර ඇති අධ්‍යයන එකොළහක් පරිශීලනය කරන ලදි. එම එක් එක් තේමාව යටතේ එම අධ්‍යයනවල අන්තර්ගතය සංක්ෂිප්ත ව දක්වා ඇත.

## 4.1 කුඩා පාසල්වල ගුණාත්මක සංවර්ධනය

මේ යටතේ පර්යේෂණ මූලාශ්‍ර තුනක් විමර්ශනය කොට ඇත.

ඉන් පළමුවැන්න, ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සඳහා සම්පත් කට්ටලයක් යන මැයෙන් ඒකනායක සහ පිරිස (2012) කර ඇති පර්යේෂණයේ අරමුණ වී ඇත්තේ ශ්‍රී ලාංකේය කුඩා පාසල් පද්ධතියේ පවතින ගැටලු සහ ඒවා යම් අසාර්ථකභාවයකට මුහුණ දී ඇත්නම් ඊට හේතු විමසා බලමින් ගතික වූ ද, කල් පවත්නා වූ ද විසඳුමක් ලබා දීම යි. පර්යේෂණ නියැදිය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ කුඩා පාසල් පහක් යොදා ගෙන ඇත. මෙහි දී ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමය උපයෝගී කර ගෙන ඇත. වර්තමාන ශ්‍රී ලාංකේය පාසල් පද්ධතියේ සමතාවේ දිළිඳු බවක් පවතින බැවින් කුඩා පාසල්වල වෙනසක් ඇති කිරීමට සමතා මූලධර්මය පදනම් කර ගත් ශික්ෂණ මානය, පාසල් සංවර්ධන මානය, ප්‍රජා සංවර්ධන මානය, මනෝ සමාජ මානය, සමාජ සංස්කෘතික මානය, පරිපාලන මානය, ළමා අයිතිවාසිකම් මානය සහ තත්ත්ව පරීක්ෂා මානය නම් වූ මාන අට ඔස්සේ සම්පත් කට්ටලය සකස් කොට ඇත. එම සම්පත් කට්ටලයේ අන්තර්ගතය අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා ප්‍රජාව යන ක්ෂෙත්‍ර යටතේ සකස් කර ඇත.

දෙවැන්න, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බහුශ්‍රේණි පාසල්වල පැන නැඟී ඇති ගැටලු පිළිබඳ අධ්‍යයනයක් ජයවර්ධන (2003) කර ඇත. මේ පාසල්වල බොහෝ විට ප්‍රාථමික අංශ පමණක් දක්නට ලැබෙන බවත් මේවායේ සිසුන්, ගුරුවරුන්, පාසල් කළමනාකරණය, ඉගැන්වීම් ආධාරක, ඉගැන්වීමේ ක්‍රම, පාසල් ප්‍රජාවගේ නොදියුණු බව හා ඔවුන්ගේ ආකල්ප යන සාධක ආශ්‍රිත ව විවිධ ගැටලු උද්ගත වී ඇති බවත් දක්වා තිබේ. එබැවින් බහුශ්‍රේණි පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත ගැටලු විමසා බැලීම, බහුශ්‍රේණි පාසල්වල විෂය නිර්දේශ / නියමිත පෙළපොත් ඉගැන්වීම සම්බන්ධ ගැටලු විමසා බැලීම, බහුශ්‍රේණි පාසල් ගුරුවරුන්ගේ පංති කාමර ක්‍රියාවලිය විමසා බැලීම සහ බහුශ්‍රේණි පාසල් සිසුන්ගේ සාධන මට්ටම්වල ස්වභාවය විමසා බැලීම මෙම

අධ්‍යයනයේ අරමුණු වේ. මේ සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ බහුශ්‍රේණි පාසල් 40ක් නියැදිය ලෙස යොදා ගෙන ඇති අතර සිසුන් 422ක ගෙන්, ගුරුවරුන් 70කගෙන් හා විදුහල්පතිවරුන් 40 දෙනෙකුගෙන් දත්ත ලබා ගෙන ඇත. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, සාධන පරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ඇගයීම් පත්‍රිකා සහ නිරීක්ෂණ යොදා ගෙන ඇත.

තෙවැන්න ලෙස ශ්‍රී ලංකාවේ ග්‍රාමීය බහුශ්‍රේණි පන්ති කාමර සඳහා ප්‍රාථමික ගණිත විෂයමාලාව අනුහුරු කිරීම (Adapting) මැයෙන් ක්‍රියාමූලික පර්යේෂණයක් Vithanapathirana (2006) විසින් සිදු කර ඇත. මෙහි අරමුණ වී ඇත්තේ බහුශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර වැඩි දියුණු කිරීම පිණිස කුඩා පරිමාණ මැදිහත් වීමක් සිදු කිරීම සහ ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයන් දැනුම්වත් කිරීමයි. බහුශ්‍රේණි ඉගැන්වීම් තත්ත්වය වැඩි දියුණු කිරීමෙන් සැමට අධ්‍යාපනය (Education for All) ඉලක්ක වෙත ළඟා වීමට දායක විය හැකි බව දක්වා ඇත.

මෙම පර්යේෂණය මූලික අදියර තුනක් යටතේ සංවිධානය කර ඇත. පළමුවන අදියරේ දී බහුශ්‍රේණි සංදර්භ සහ ඉගැන්වීම් පිළිබඳ තොරතුරු සෙවීම ද, දෙවන අදියරේ දී පළමුවන අදියරේ අනාවරණ පදනම් කර ගෙන බහුශ්‍රේණි ඉගැන්වීමට මැදිහත් වීම ද, තෙවන අදියරේ දී මැදිහත්වීම තක්සේරු කිරීම ද සිදු කර ඇත. මැදිහත් වීමේ අදියරේ දී දෙන ලද මාතෘකාවක් සම්බන්ධ ව පොදු ක්‍රියාකාරකම් සහ විවිධාංගීකරණය කරන ලද ක්‍රියාකාරකම් මගින් බහුශ්‍රේණි පන්ති ආමන්ත්‍රණය කිරීම සඳහා නවෝත්පාදන උපායමාර්ගයක් නිර්මාණය කර ඇත. එම උපායමාර්ගය පියවර හතරක් යටතේ සංවිධානය කර ඇත. පළමු පියවරේ දී එක් එක් ශ්‍රේණි මට්ටම සඳහා නියමිත අරමුණු අධ්‍යයනය කිරීමෙන් ශ්‍රේණි සංයෝජනයට සුදුසු මට්ටම පිළිබඳ හැඳින්වීමක් කර ඇත. දෙවන පියවරේ දී පාඩම ගොඩනැංවීමේ දී ශ්‍රේණි මට්ටම්වලට ගැළපෙන පරිදි අනුපිළිවෙළ සංවර්ධනය සහ ශ්‍රේණිවලට ගැළපෙන පරිදි විචලනය කර ඇත. තෙවන පියවරේ දී අදාළ ශ්‍රේණි මට්ටම්වලට

ගැළපෙන පරිදි විවිධ ශ්‍රේණිවල පැවරුම් සකස් කර ඇත. සිවුවන පියවරේ දී සිසුන් කාර්යයේ නියුතු වූ මට්ටම අනුව මාතෘකාව පිළිබඳ වැඩිදුර ඉගෙනීමට සිසුන් මෙහෙයවීම පිළිබඳ නිගමනවලට එළැඹ ඇත. මෙහි ක්‍රමෝපාය වී ඇත්තේ ශ්‍රේණි මට්ටම් විවිධාංගීකරණයෙන් සමස්ත පන්තියට ම ඉගැන්වීමයි.

## 4.2 කුඩා පාසල් විදුහල්පති කළමනාකරණ උපායමාර්ග

මේ පිළිබඳ ව ද මූලාශ්‍ර දෙකක් විමර්ශනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සංවර්ධනය සඳහා විදුහල්පතිවරුන් භාවිත කරනු ලබන සංවර්ධන උපායමාර්ග පිළිබඳ කස්තුරිආරච්චි (2013) කරන ලද අධ්‍යයනය පළමුවැන්නයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ එසේ ආදර්ශවත් ලෙස සංවර්ධනය වී ඇති කුඩා පාසල්වල විදුහල්පතිවරුන් විසින් යොදා ගෙන ඇති සංවර්ධන උපායමාර්ග හඳුනා ගැනීමයි. මේ යටතේ එම පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ගවල ස්වභාවය හඳුනා ගැනීම, ඒ පිළිබඳ ව පාසල් පාර්ශ්වකරුවන්ගේ අවබෝධය ගවේෂණය සහ එම විදුහල්පතිවරුන්ට එල්ල වී ඇති අභියෝග සහ බාධක හඳුනා ගැනීම අරමුණු කර ගෙන ඇත. මෙම අධ්‍යයනයේ නියැදිය ලෙස සංවර්ධනයට ලක් වූ කුඩා පාසල් අතරින් පාසල් තුනක් සහේතුක ව තෝරා ගෙන සිද්ධි අධ්‍යයන ක්‍රමෝපාය උපයෝගී කර ගෙන ඇත. සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ලේඛන අධ්‍යයන යන ක්‍රම තුනෙන් දත්ත රැස් කර ගෙන තේමා විශ්ලේෂණයෙන් දත්ත විශ්ලේෂණය කර ඇත.

කුඩා පාසල්වල විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ උපායමාර්ග භාවිතයේ සුවිශේෂිතා පිළිබඳ වාකිෂ්ඨ (2014) කර ඇති අධ්‍යයනය දෙවැන්නයි. මෙම සුවිශේෂි කුඩා පාසල් එසේ ක්‍රමික සංවර්ධනය කරා ගමන් කරන්නේ කෙසේ ද යන්නත්, ඒ සඳහා එම පාසල්වල විදුහල්පතිවරුන් භාවිතයට ගනු ලැබූ කළමනාකරණ උපායමාර්ග මොනවා ද යන්නත්, එම උපායමාර්ග කුමන වාතාවරණයක් යටතේ කෙසේ ක්‍රියාත්මක කරනු ලබයි ද යන්නත් ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වී ඇත. මෙම පර්යේෂණය දකුණු පළාතේ

ක්‍රියාත්මක වූ කුඩා පාසල්වලට පමණක් සීමා කර ඇති අතර නියැදිය සඳහා දකුණු පළාතෙන් සහේතුක ව තෝරා ගත් පාසල් 33ක් පළමු අදියරේ දී සමීක්ෂණයට ලක් කර ඇති අතර දෙවන අදියරේ දී ඉන් සහේතුක ව තෝරා ගත් පාසල් 4ක් සිද්ධි අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. දත්ත රැස් කිරීම සඳහා සමීක්ෂණ ප්‍රශ්නාවලි, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ඉලක්ක කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ලේඛන විශ්ලේෂණ යන ක්‍රම උපයෝගී කර ගෙන ඇත. ලබා ගත් ප්‍රමාණාත්මක දත්ත, වගු සහ ප්‍රතිශත ආකාරයෙන් නිරූපණය කර, ගුණාත්මක දත්ත විශ්ලේෂණයට, භූමිගත න්‍යාය පාදක කර ගත් තේමා සහ අන්තර්ගත විශ්ලේෂණය භාවිත කර ඇත.

## 4.3 කුඩා පාසල් නඟා සිටුවීම

මේ යටතේ ද මූලාශ්‍ර දෙකක් පරිශීලනය කොට ඇත.

පළමු ව දකුණු පළාතේ කුඩා පාසල්වල පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) කර ඇති අධ්‍යයනය සළකා බලනු ලැබේ. පාසලේ කළමනාකරණ සහ අධ්‍යාපන ව්‍යවහාර පිළිබඳ ගැටලු පාසල අභ්‍යන්තරයෙන් ම විසඳා පාසලේ ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා වූ පාසල් නඟා සිටුවීමේ වැඩසටහන ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට එක සේ හඳුන්වා දුන් නමුත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කුඩා පාසල්වල ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක බව දක්වා ඇත. එබැවින් කුඩා පාසල්වල පාසල නඟා සිටුවීමේ වැඩසටහනේ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක, ක්‍රියාත්මක කිරීමේ දී මතු වී ඇති දුෂ්කරතා සහ ඒවා ජය ගැනීමට පාසල විසින් යොදා ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග අධ්‍යයනය කර පාසල් නඟා සිටුවීමේ වැඩසටහන කුඩා පාසල්වල ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණ අරමුණු වී ඇත. ස්ථරායන අහඹු නියැදි ක්‍රමයෙන් දකුණු පළාතේ එක් එක් අධ්‍යාපන කලාපයේ සිසුන් 100ට අඩු කුඩා පාසල් සංඛ්‍යාවට සමානුපාතික වන පරිදි පාසල් 161ක නියැදියක් තෝරා ගත්

බව වාර්තා කොට තිබේ. විස්තරාත්මක සමීක්ෂණ ක්‍රමවේදය උපයෝගී කර ගෙන දත්ත රැස් කර ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජ සංවර්ධනය සඳහා කුඩා පාසල් භාවිත කිරීම පිළිබඳ ව දමයන්ති (2012) කර ඇති අධ්‍යයනය දෙවැන්න යි. මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ සෑම අධ්‍යාපන කලාපයක ම ළමයින් 50ට අඩු පාසල් පවතින බවත් මේවා කලකට ඉහත දී සාර්ථක ව පවත්වා ගෙන ගිය නමුත් අද වන විට ග්‍රාමීය ජනතාව ප්‍රතික්ෂේප කිරීම නිසා වැසී යාමේ තර්ජනයට ලක් ව ඇති බව පෙන්වා දී ඇත. එබැවින් වැසී යාමට ආසන්න තත්ත්වයේ පවතින පාසල් පිළිබඳ තොරතුරු රැස් කිරීමත්, රැස් කර ගත් තොරතුරු ඇසුරෙන් පාසල් වැසී යාම වැළැක්වීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු වී ඇත. මේ සඳහා බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාපයක පාසල් 20ක නියැදියක් පාදක කර ගනිමින් එම පාසල්වල පවත්නා තත්ත්වය අනාවරණය කර ගෙන ඇත. ඒ අනුව එම කුඩා පාසල් නඟා සිටුවීම පිණිස යෝජනාවලියක් ඉදිරිපත් කර ඇත.

## 4.4 කුඩා පාසල් සංවර්ධනය කිරීමේ විදුහල්පති අත්දැකීම්

කුඩා පාසල් සංවර්ධනය කිරීමේ ලා නවෝත්පාදන අනුගමනය කරනු ලැබූ විදුහල්පති ප්‍රත්‍යවේක්ෂණ අධ්‍යයන හතරක සාරාංශ මෙහි දී ඉදිරිපත් කෙරේ (හියුබට්, 2008; රත්නායක, 2008; වාසලමුදලි, 2008; ලේකම්ගේ, 2008). තෝරා ගත් කුඩා පාසල්වල විදුහල්පතිවරුන් එම පාසල් සංවර්ධනය කිරීමේ ලා ලැබූ අත්දැකීම් පාදක කර ගෙන සකස් කරනු ලැබූ ස්ව ව්‍යවහාර ප්‍රත්‍යවේක්ෂණ (Self -reflective practice) වාර්තා සකස් කර ඇත. මෙහි දී පර්යේෂණ පරිශ්‍රය ලෙස එක් එක් විදුහල්පතිවරයා සේවය කළ කුඩා පාසල යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනවල දී පශ්චාද් සාධක පර්යේෂණ ක්‍රමය (Ex post facto research method) භාවිත කර ඇත. මේ සඳහා ඒ ඒ විදුහල්පති සතු වූ ආයතන මතකය ද, පාසල් සතු වූ ලේඛන ද, පාසල් ප්‍රජාවගේ

සංජානන ද, මේ සියල්ල පිළිබඳ විදුහල්පති ප්‍රත්‍යවේක්ෂණ ද පදනම් කර ගෙන ඇත. එහි දී එම පර්යේෂණ ක්‍රමය ගැඹුරු පදනමින් භාවිත කර ඇත. මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව සු/ජොහානාදන් කණිටු විදුහල (හියුබට්, 2008), බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ ඇල්ල කොට්ඨාසයට අයත් බ/වලස්බැද්ද විදුහල (රත්නායක, 2008), කන්තලේ අධ්‍යාපන කලාපයේ ත්‍රි/ මහවැලි පුර විද්‍යාලය (වාසලමුදලි, 2008) සහ බස්නාහිර පළාතේ හෝමාගම අධ්‍යාපන කලාපයේ හංවැල්ල කොට්ඨාසයේ පුවක්පිටියේ හෝ/මානකඩ කනිෂ්ඨ විද්‍යාලය (ලේකම්ගේ, 2008) යන පාසල් යොදා ගෙන ඇත.

## 5.0 පර්යේෂණාශ්‍රිත ලේඛන ඇසුරෙන් හඳුනා ගත් අනාවරණ

අධ්‍යයනයේ අරමුණු අනුව ඉහත පරිශීලනය කරනු ලැබූ අධ්‍යයනවලින් ඉදිරිපත් කර ඇති අනාවරණ තේමා තුනක් යටතේ වර්ග කර දැක්විය හැකි ය. එනම්,

- ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග සහ අත්දැකීම්
- කුඩා පාසල් මුහුණ පා ඇති ගැටලු ඇසුරෙන් ඒවා පැවැත්වීමේ වර්තමාන තත්ත්වය
- කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නගා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා

මෙම එක් එක් තේමා යටතේ ඉදිරිපත්ව ඇති අනාවරණ වෙන් වෙන් ව සහ විස්තරාත්මක ව පහතින් දැක්වේ.

### 5.1 ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග සහ අත්දැකීම්

#### 5.1.1 ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල විදුහල්පතිවරුන් යොදා ගන්නා ලද සංවර්ධන උපායමාර්ග

ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සංවර්ධනය සඳහා විදුහල්පතිවරුන් භාවිත කරන සංවර්ධන උපායමාර්ග පිළිබඳ අධ්‍යයනයෙන් කස්තුරිආරච්චි

(2013) හවුල් තීරණ ගැනීම සහ ප්‍රජා සහභාගිත්වය, විදුහල්පති නායකත්ව, සැලසුම් සහ අරමුදල් සම්පාදනය, ආකර්ශනීය නායකත්වය සහ අලෙවිකරණ ක්‍රමෝපාය යන තේමා යටතේ උපායමාර්ග අනාවරණය කර ගෙන ඇත. එසේ ම වාකිෂ්ඨ (2014) අනුව කුඩා පාසල්වලින් අනාවරණය කරනු ලැබූ සන්දර්භගත ලක්ෂණ හා කළමනාකරණ උපායමාර්ග අනෙකුත් කුඩා පාසල්වල කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතයට ගත හැකි ය. ඒ අනුව එම සංවර්ධන උපායමාර්ග සංක්ෂිප්ත ව පහතින් දක්වා ඇත.

### අ. හවුල් තීරණ ගැනීම සහ ප්‍රජා සහභාගිත්වය

පර්යේෂණයට සහභාගි වූ විදුහල්පතිවරුන්ගෙන් බහුතරයක් පාර්ශ්වකරුවන්ගේ අදහස් හා යෝජනා පිළිගනිමින් හවුල් තීරණ ගැනීම පාසල් සංවර්ධනය සඳහා භාවිත කර ඇත. එසේ ම පාර්ශ්වකරුවන් පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් සපයා දෙමින් සහයෝගය දක්වා ඇත (කස්තුරිආරච්චි, 2013). සක්‍රිය ප්‍රජා සම්බන්ධතා ජාලයක් පවත්වා ගෙන යාම, පාසලේ පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය දායකත්වය සහ පාසලෙන් පරිබාහිර ආයතන පාසල වෙත දක්වන උනන්දුව යන සාධක වාකිෂ්ඨ (2014) දක්වා ඇත.

### ආ. විදුහල්පති නායකත්වය

කස්තුරිආරච්චි (2013) අනාවරණය කරන පරිදි සාර්ථකත්වයට පත් කුඩා පාසල් විදුහල්පතිවරුන් විපර්යකරණ නියෝජිතයන් ලෙස කළමනාකරණයේ මූලධර්ම සහ න්‍යාය නිවැරදි ව යොදා ගෙන ඇති අතර "පළමු ව ආකල්ප හා ගුණාත්මක බව" ("attitudes and quality first") යන දර්ශනය මත පදනම් ව එම පාසල් සංවර්ධනය කර ඇත. පර්යේෂණයට සහභාගි වූ විදුහල්පතිවරුන්ගෙන් බහුතරයක් පාසල් කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ හොඳ දැනුමක් ලබා තිබීම, ඔවුන්ගේ සුදුසුකම්, කළමනාකරණ දැනුම සහ අත්දැකීම් පාසල ඵලදායී ලෙස මෙහෙයවීමට බලපා ඇත. එම විදුහල්පතිවරුන් සෑම විට ම අවස්ථායික නායකත්ව ශෛලිය (Situational leadership

style) භාවිත කරන අතර ඔවුන් ඵලදායී උපදේශන නායකයින් (Effective instructional leaders) ලෙස ක්‍රියා කර ඇති බව අනාවරණය කොට ඇත (කස්තුරිආරච්චි, 2013). කළමනාකරණ බාධාවලින් මතු කර ගත් නව කළමනාකරණ සංස්කෘතිය, විදුහල්පතිවරයාගේ නායකත්ව රටා හා ගුණාංග කැපී පෙනෙන බව වාකිෂ්ඨ (2014) දක්වා ඇත.

### ඇ. සැලසුම් සහ අරමුදල් සම්පාදනය

කස්තුරිආරච්චි (2013) ගේ අධ්‍යයනයෙන් කුඩා පාසල් විදුහල්පතිවරුන් පස් අවුරුදු සැලසුම් සහ වාර්ෂික සැලසුම් සකස් කර වසර ආරම්භයේ දී වර්ෂයේ පාසල් සැලසුම්, ව්‍යාපෘති සහ ඉලක්ක හඳුන්වා දී ඇති බවත්, වසර තුළ සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල වගකීම් සහ කමිටුවල වගකීම් අදාළ පාර්ශ්වකරුවන් වෙත පවරා ඇති බවත් අනාවරණය කොට ඇත. එසේම, වාකිෂ්ඨ (2014) විධිමත් පාසල් සැලසුම්කරණය එම පාසල්වල කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත. පාසල් සංවර්ධනයට අරමුදල් සම්පාදනයේ දී දේශපාලන නායකයින්, ව්‍යාපාරික සංවිධාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ සුභ පතන්නන් යන බාහිර ප්‍රජා සාමාජිකයින් සමඟ ඉතා හොඳ සම්බන්ධතා ජාලයක් පවත්වා ගෙන යන බවත් අරමුදල් ඉල්ලා සිසුන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට බලපෑම් කර නැති බවත් අනාවරණය කොට ඇත.

### ඈ. අලෙවිකරණ උපායමාර්ග සහ ආකර්ශනීය නායකත්වය (Outstanding marketing strategies and charismatic leadership)

කස්තුරිආරච්චි (2013) ගේ අධ්‍යයනයෙන් පාසල් කළමනාකරණයේ දී ධනාත්මක ආකල්ප දක්වමින් තම කාර්යභාරය ඉටු කිරීමට විදුහල්පතිවරුන්ගේ කැපවීම ඔවුන් සතු කුසලතා සහ නිර්මාණශීලිත්වය ඍජු ව ම යොදා ගෙන ඇත. තම පෞද්ගලික උත්සාහයෙන් පාසල සඳහා නව තාක්ෂණය භාවිත කරන බව ද, හොඳ ව්‍යවසායක කුසලතා සහ නිර්මාණාත්මක අදහස් ද දක්වා ඇත. සිසුන් සහ දෙමව්පියන් ස්වේච්ඡාවෙන් ලබා දුන් ශ්‍රමය පමණක්

භාවිත කර පාසල්වල පන්ති කාමර හිඟයට පිළියමක් ලෙස අඩු වියදම් ගොඩනැගිලි ඉදි කර ඇති බව ද අනාවරණය වී ඇත. විදුහල්පතිවරුන් තම පාසල් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා බොහෝ අලෙවිකරණ උපාය මාර්ග භාවිත කර ඇත. මෙම විදුහල්පතිවරුන් මාධ්‍යවේදීන් හා ජනමාධ්‍ය සමඟ ඉතා හොඳ සම්බන්ධතාවක් පවත්වා ගෙන යෑම කැපී පෙනේ. මෙම විදුහල්පතිවරුන් තම පාසල ජනප්‍රිය කරවීමට සහ පාසලට ඇති ඉල්ලුම වැඩි කිරීම සඳහා විවිධ උපාය මාර්ග භාවිත කර ඇති බවත්, මේ හේතුවෙන් වසරින් වසර ශිෂ්‍ය සංඛ්‍යාව වේගයෙන් වැඩි වී ඇති බවත් පෙන්වා දී තිබේ. පාසලේ ක්‍රියාත්මක සංස්කෘතිය හා සමාජ පරිසරයට අනුගත වන ආකාරයට හා එම පාසල් අනන්‍ය වූ සංස්කෘතියට අදාළ ව නිර්මාණශීලී හා ආවේණික වූ කළමනාකරණ උපායමාර්ග, පාරිසරික, සංස්කෘතික, සමාජයීය හා ආර්ථික වටපිටාවට ගැළපෙන පරිදි නිර්මාණශීලී නායකත්ව ලක්ෂණ හොඳින් ඉස්මතු වන බවත් හඳුනා ගෙන ඇත. එකී සාධක පාසල ප්‍රගමනය කරා මෙහෙයවනු ලබන ප්‍රධාන බලවේගය බව ද කස්තුරිආරච්චි (2013) අනාවරණය කර ගෙන ඇත.

**ඉ. සම්පත් කළමනාකරණය**

කුඩා පාසල්වල විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ උපායමාර්ග පිළිබඳ ව අධ්‍යයනයේ දී වාකිෂ්ඨ (2014), පාසලේ සම්පත් උපරිම ඵලදායී ලෙස හා කාර්යක්ෂම ව භාවිතය සහ මානව සම්පත් කළමනාකරණය පාසල ප්‍රගමනය කරා මෙහෙයවන ප්‍රධාන බලවේගයක් බව හඳුනා ගෙන ඇත.

### 5.1.2 **කුඩා පාසල් විදුහල්පති අත්දැකීම්**

ඉහත දී සාකච්ඡා කළ කුඩා පාසල් සංවර්ධනය කිරීමේ ලා නවෝත්පාදන යටතේ එක් එක් පාසල්වල අත්දැකීම් සුවිශේෂ වන බැවින් එම එක් එක් පාසලේ විදුහල්පතිවරුන් දක්වන ලද අත්දැකීම්වල සාරාංශ වෙන් වශයෙන් පහතින් දක්වා ඇත (හියුබට්, 2008; රත්නායක, 2008; වාසලමුදලි, 2008; ලේකම්ගේ, 2008).

### අ. සු/ජොහානාදන් කණිටු විදුහල

හියුබර්ට් (2008) දක්වන පරිදි අතීතයේ දී මෙම පාසල උඩුබද්දාව රෝමානු කතෝලික විදුහල යනුවෙන් හඳුන්වා ඇත. කුඩා පාසලක් වූ මෙයට 1998 වර්ෂයේ ඇතුළත් වී ඇත්තේ ළමයින් හය දෙනෙක් පමණකි. විදුහල ගොඩ නැංවීමේ දී බාහිර පිරියත සංවර්ධනයට පෙර අධ්‍යාපන සංවර්ධනයට මූලික ස්ථානය ලබා දීමෙන් විදුහලේ දියුණුව ආරම්භ වී ඇත. ඉන් ලැබුණ ප්‍රසිද්ධිය විදුහලේ භෞතික අංග දියුණු කිරීමට උපකාර කර ගෙන ඇත. පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල ඉහළ නැංවීමෙන් සහ විදුහල්පති තම දරුවා ද මෙම පාසලට ම ඇතුළත් කිරීමෙන් ප්‍රජාවගේ විශ්වාසය වැඩි කර ගෙන ඇත. 2001 වසරේ දී විදුහලේ ශිෂ්‍ය සංඛ්‍යාව 110ක් දක්වා වර්ධනය වී ඇත. රජයේ ප්‍රතිපාදන මත ගොඩනැගිල්ලක්, දෙමාපිය අනුග්‍රහය මත ජල සම්පාදන ක්‍රමයක්, පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත පරිගණක කාමරයක් සහ ප්‍රාථමික දරුවන් සඳහා තූර්ය වාදක කණ්ඩායමක් ආරම්භ කිරීම ඇතුළු විවිධ භෞතික සම්පත් ද ලබා ගෙන ඇත. 2002 වසරේ නව වන ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වීම අනුමත කිරීමෙන් පසු ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වී ඇත. ප්‍රාථමික දරුවන්ගේ නාට්‍යයකට සමස්ත ලංකා ජයග්‍රහණයක් ද, සිංහල තරගයේ රන් පදක්කමක් ද, යුනෙස්කෝ චිත්‍ර තරගයේ ලෝකඩ පදක්කමක් ද ලැබීමෙන් විදුහලේ දියුණුවේ පිය මං සටහන් වී ඇත. එසේ ම මෙම විදුහල්පතිවරයා කුඩා විදුහල් නඟාලීමට සම්බන්ධ ව ඇගයීමට ලක් වී ඇත. 2007 වසර වන විට විදුහලේ ශිෂ්‍ය සංඛ්‍යාව 200 ඉක්මවා ඇත. මෙම විදුහල්පතිවරයා සතු සමාජයේ විවිධ අභියෝග ඉදිරියේ නො සැලී ක්‍රියා කළ හැකි නම්‍යශීලී පුද්ගලයකු වීම, අන්‍ය මත ඉවසීම, ආගම් සහනශීලී බව, ප්‍රියමනාප බව යන ගුණාංග කැපී පෙනේ. දෙමාපියන්ගේ බලාපොරොත්තුව ඉටු කර දීම නිසා විදුහල කෙරේ ප්‍රජාව ඉමහත් භක්තියක් දක්වා ඇති බව විද්‍යමාන වේ (හියුබර්ට්, 2008).

### ආ. බ/වලස්බැද්ද විදුහල

රත්නායක (2008) ට අනුව බණ්ඩාරවෙල අධ්‍යාපන කලාපයේ ඇල්ල කොට්ඨාසයට අයත් මෙම විදුහල, කලකට ප්‍රථම වසා දැමීමේ

තර්ජනයට ලක් ව තිබූ අතිදුෂ්කර පාසලකි. ඒ වන විට ශිෂ්‍ය සංඛ්‍යාව 14ක් දක්වා අඩු වී පැවතී ඇත. එම අභියෝගයට මුහුණ දෙමින් විදුහල දියුණු කිරීමේ කාර්යභාරය භාර ගත් විදුහල්පති, ප්‍රදේශවාසීන් විසින් අත්පත් කර ගෙන තිබූ පාසල් භූමිය නිරවුල් කර ගෙන, පාසලේ ගුණාත්මක සංවර්ධනය පිණිස විවිධ ව්‍යාපෘති 72ක් ක්‍රියාත්මක කර ඇත. 2008 වන විට අ.පො.ස. (උ. පෙ.) පන්ති පැවැත්වෙන මහා විද්‍යාලයක් බවට පත් වී ඇත. 2007 වර්ෂයේ සාමාන්‍ය පෙළට පෙනී සිටි සිසුන්ගෙන් 98%ක් සමත් වී ඇත. ශිෂ්‍යත්ව ප්‍රතිඵල ද ඒ අයුරින් ම පෙන්වා ඇත. විශාල ගුරු හිඟයක් පාසලේ තිබුණත් මේ ආකාරයට විශාල දියුණුවක් දැකිය හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ හොඳ ම පාසල ලෙස ද ජනාධිපති සම්මාන ද ලබා ඇත (රත්නායක, 2008).

### ඇ. ත්‍රි/ මහවැලි පුර විද්‍යාලය

වාසලමුදලි (2008) දක්වන පරිදි කන්තලේ අධ්‍යාපන කලාපයේ පිහිටා ඇති මෙම විදුහල වසර 20කට වැඩි කාලයක් ත්‍රස්තවාදී උවදුරු හා වල් අලි තර්ජනවලට මුහුණ දෙමින් ක්‍රියාත්මක වී ඇත. මාවිල්ආරු අමුණ මුදා ගැනීමේ මෙහෙයුම් පැවති සමයේ කාලතුවක්කු පිපිරීම්වලින් පාසලට අලාභහානි සිදු වී ඇත. ග්‍රාමීය දුෂ්කර පාසලක් වූ මෙහි දරුවාගේ සමාජ සංවර්ධනය මුළුමනින් ම ගුරු භවතුන්ට පැවරී තිබූ බැවින් මේ සඳහා ප්‍රාථමික ගුරුවරුන් සන්නද්ධ කර ඇත. විෂය නිර්දේශය අභිබවා ගිය සමාජ භූමිකාවකට ගුරු භවතුන් නැඹුරු කිරීම, මෙම පාසලේ සංවර්ධනයේ මූලිකාංගය වී ඇත. පාසල සංවර්ධනයේ දී පාසල් සංවර්ධන සමිති සාමාජිකත්වයෙන් වැඩි ශ්‍රම දායකත්වයක් ලබා ගෙන ඇත. අවශ්‍ය මූල්‍ය දායකත්වය සුභ පතන්නන්ගෙන් සපයා ගැනීමට කටයුතු කර ඇත. පාසල් භෞතික පරිසරය සහ ශිෂ්‍යයා පමණක් නො ව දෙමව්පියන් ඇතුළු වැඩිහිටියන් සංවර්ධනය කිරීමේ වගකීම ද පාසල ඉටු කර ඇත. විධිමත් විෂයමාලාව මෙන් ම අවිධිමත් විෂයමාලාව කෙරෙහි ද දැඩි අවධානය යොමු කර ඇත. ඒ අනුව පාසලට ගැළපෙන සංස්කෘතිය කෙරෙහි ශිෂ්‍ය නායකයින්, නිල ඇඳුම, ගුරු භවතුන්ගේ හැසිරීම,

පාසලේ ප්‍රිය මනාප බව සහ පිළිවෙළ යන කරුණු විශේෂයෙන් බලපා ඇත. පාසලෙහි ඉහළ සිට පහළට සහ පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන මනා සන්නිවේදනය, විනිවිදභාවය, කාර්ය මණ්ඩලයේ අවංක කැප කිරීම, ඔවුන්ට අවශ්‍ය භෞතික සහ මානසික පහසුකම් සපයා දීම යන කරුණු නිසා පාසල සීග්‍රයෙන් දියුණු වී ඇත (වාසලමුදලි, 2008).

### ඈ. බප/ හෝ /මානකඩ කනිෂ්ඨ විද්‍යාලය

ලේකම්ගේ (2008) ට අනුව මෙම විද්‍යාලයේ ප්‍රථමයෙන් ප්‍රජා සම්බන්ධතා ගොඩ නැංවීමට කටයුතු කර ඇත. 2001 වර්ෂයේ දී ඉගෙනුම ලැබුවේ ළමයින් 17ක් වන අතර ඉන් 10 දෙනෙක් ම දෙමළ සිසුන් බව දක්වා ඇත. ගුරු හිඟයක් තිබුණ ද ශ්‍රේණි අනුව ඉගැන්වීමට කටයුතු කර ඇත. පාසල් පිරියත අලංකරණය කර ඇත. සෑම ගෙයක් පාසා ම විදුහල්පති ගොස් සිසු ප්‍රවේශය වැඩි කිරීමට කටයුතු කර ඇත. දෙමළ ජනයා පදිංචි කම්කරු නිවාසවලට ගොස් දෙමළ බසින් කථා කර ඔවුන් පාසල වෙත ගෙන්වීමට කටයුතු කරන ඇත. 2001 වර්ෂයට වඩා 2008 දී, සිසු ප්‍රවේශය අට ගුණයකින් වැඩි වී ඇත. ප්‍රජා සහයෝගය ලබා ගෙන, ප්‍රධාන ශාලාව පිළිසකර කර, තීන්ත ආලේප කර ඇත. චිත්‍ර ඇඳීම සඳහා ගමේ මිනිස්සු දායක කර ගෙන ඇත. විනාශ වූ පුස්තකාල පොත් සියල්ල ම යළි පාවිච්චියට සකසා ගෙන ඇත. නොවිධිමත් අධ්‍යාපන වැඩසටහනක් පාසලේ දියත් කර කාන්තාවන්ට ආහාර සැකසීම හා මල් සැකසීම පිළිබඳ පාඨමාලා ඉගැන්වීමට පාසල කටයුතු යොදා ඇත. පාසලේ දිළිඳු දරුවන්ට ඇඳුම් පැළඳුම් බෙදා දී ඇත. පාසලට උචිත පරිසරයක් නිර්මාණය කර ඇත (ලේකම්ගේ, 2008).

මෙහි දක්වා ඇති කුඩා පාසල් සංවර්ධනය සඳහා විදුහල්පතිවරුන්ගේ අත්දැකීම් විශ්ලේෂණයෙන් ග්‍රාමීය පාසල් දියුණු කරන්නට හැකි බවත්, ග්‍රාමීය පාසල් දියුණු වීමේ ඓතිහාසික රටා සහ දියුණුවේ ප්‍රතිඵල ලෙස දිස් වන සංවර්ධන රටා විවිධ බවත්, එම විවිධත්වය පාසලේ භෞතික පරිසරය, විදුහල්පති පෞරුෂ රටාව, නිලධාරී-දේශපාලන ජාලය, සහ ප්‍රජා-ගුරු-සිසු සමූහයේ චරිත ලක්ෂණ මත හැඩ ගැසෙන

බවත්, ශිෂ්‍ය ආකර්ෂණය නැති නිසා වැසෙන්නට යන පාසල් නො වැසී පවත්වා ගෙන යන්නට හැකි වන ලෙස ප්‍රජා ආකර්ෂණය ලබා ගැනීමේ ක්‍රමවේද පවතින බවත්, මෙකී ප්‍රජා ආකර්ෂණය සඳහා පාසලක භෞතික වාතාවරණය හා භෞතික සම්පත්වලට අමතර ව, සමහර විට ඒවාටත් වඩා, විදුහල්පතිගේ දර්ශනයට පදනම් වන ජන විඥානය සහ ඔහු / ඇය ගැන පවතින ප්‍රජා විශ්වාසය හා ඔහුගේ / ඇයගේ ශක්‍යතාව පිළිවෙළ වී තිබුණත්, ඒවා සමස්ත අධ්‍යාපන පද්ධතියේ අංග ලෙස සමායෝජනය වී නැති බවත්, කුඩා පාසල් සංවර්ධනය කිරීමේ ලා නවෝත්පාදන අනුගමනය කරනු ලැබූ විදුහල්පති ප්‍රත්‍යවේක්ෂණ අධ්‍යයන හතරෙන් ප්‍රකාශ වී ඇත (හියුබට්, 2008; රත්නායක, 2008; වාසලමුදලි, 2008; ලේකම්ගේ, 2008).

## 5.2 කුඩා පාසල් මුහුණ පා ඇති ගැටලු

කුඩා පාසල් සම්බන්ධ ව පරිශීලනය කරන ලද අධ්‍යයනවලින් (ඒකනායක සහ සෙසු අය, 2012, කස්තුරිආරච්චි, 2013), ජයවර්ධන, 2003, පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු, 2018) (දමයන්ති, 2012), (වාකිෂ්ඨ, 2014) පරිපාලනමය ගැටලු, සිසුන් සම්බන්ධ ගැටලු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු, ප්‍රජාව සම්බන්ධ ගැටලු, මානව සහ භෞතික සම්පත් සම්බන්ධ ගැටලු අනාවරණය වී ඇත. එම එක් එක් ක්ෂේත්‍ර යටතේ ඒවා පහතින් දක්වා ඇත.

### 5.2.1 පරිපාලනමය ගැටලු

ඒකනායක සහ සෙසු අය (2012) විසින් කුඩා පාසල් සම්බන්ධ ව අයෝජනවල පවත්නා ගැටලු සහ කුඩා පාසල් සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටලු පවතින බව දක්වා ඇත. ඒවා විස්තර කරන ඒකනායක සහ සෙසු අය (2012) පාලක පක්ෂයෙන් කුඩා පාසල් සඳහා නිසි ආයෝජනයක් නො වීම, නාගරික හා අනෙක් සංවර්ධන ප්‍රදේශවලට වැඩි අවධානයක් යොමු වීම නිසා ජාතික සංවර්ධන ව්‍යාපෘතිවල දී කුඩා පාසල් පිහිටි ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රශ්න මග හැරීම, පාසල් සංවර්ධනයේ දී ඍජු නො වූ සමස්ත ප්‍රතිපත්ති පැවතීම ගැටලු සහගත බව දක්වා ඇත. කස්තුරිආරච්චි (2013) අනුව කුඩා පාසල්

මුහුණ පා ඇති බාධක සහ අභියෝග වන්නේ පාසල සම්බන්ධයෙන් අනවශ්‍ය නීතිරීතිවල බලපෑම සහ ඵලදායී මානව සම්පත් කළමනාකරණයට විදුහල්පතිවරුන්ට පවරා ඇති බලය සීමිත වීම යි. පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) අනුව පාසල් නඟා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් අධික ලෙස නිවාඩු ලබා ගැනීම, පිරිමි ගුරුවරුන්ගේ සේවය නොලැබීම යන ගුරුභවතුන් සම්බන්ධ ගැටලු සහ පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ සංකීර්ණ ස්වභාවය, අමතර ලිපි ලේඛන නඩත්තු කිරීමට අමතර කාලයක් වැය වීම, සහාය කාර්ය මණ්ඩලයක් නොමැති වීම, කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලැබෙන මග පෙන්වීම ප්‍රමාණවත් නොවීම ගැටලු වෙයි.

### 5.2.2 සිසුන් සම්බන්ධ ගැටලු

සිසුන්ට පාසල් උපකරණ ලබා ගැනීමේ අපහසුතා සහ අතරමැදි ශ්‍රේණිවල දී සිසුන් පාසල් හැර යාම යන ගැටලු ජයවර්ධන (2003) දක්වා ඇත. පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) අනුව සිසුන්ගේ පාසල් පැමිණීමේ දුර්වලතා, අඩු පෙලඹීම සහ අඩු සාධන මට්ටම් යන සිසුන් සම්බන්ධ ගැටලු පැන නැගී ඇත.

### 5.2.3 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු

ගුරු ප්‍රජාවගේ වෘත්තියිකභාවය අඩු වීම, විෂයමාලාවේ ඇති සංකීර්ණතාව, ඉගෙනුම් පරිසරය සතුටුදායක නො වීම, සම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම භාවිතය, ගුරු කේන්ද්‍රීය බව යන ගැටලු ඒකනායක සහ සෙසු අය (2012) විසින් අනාවරණය කොට ඇත. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ගුරුවරුන් නොමැති වීම, බහුශ්‍රේණි ඉගැන්වීම සිදු කරන බැවින් සිංහල හා ගණිතය විෂය හැරුණු කොට අනෙක් විෂය ඉගැන්වීමට අවස්ථාව නොලැබීම, බහු ශ්‍රේණි ලෙස පන්ති පවත්වා ගැනීමට ගුරුවරුන්ගේ ඇති නොකැමැත්ත, ඉගැන්වීමේ ක්‍රමවල අඩුපාඩු, සිංහල සහ ගණිතය විෂය මට්ටම්වල සාධන මට්ටම් ඉතා ම පහළ තත්ත්වයක පැවතීම යන ගැටලු ජයවර්ධන (2003) දක්වා ඇත. විෂය බාහිර ක්‍රියා නො කරන බවට දෙමව්පියන්ගේ

චෝදනා එල්ල වීම, බහු ශ්‍රේණි ඉගැන්වීම පිළිබඳ ගුරුවරුන් දැනුම්වත් නො වීම යන ගැටලු දමයන්ති (2012) දක්වා ඇත.

### 5.2.4 ප්‍රජාව සම්බන්ධ ගැටලු

ප්‍රදේශ වැසියන්ගේ මන්දගාමී බව, එම ප්‍රදේශවල ම සිටින හැකියාව ඇති අය විසින් කුඩා පාසල් නොසලකා හැරීම, ප්‍රජාවගේ පසුබටතාව, ප්‍රජාවේ සාර්ථක ආදර්ශ නො වීම, අඩු රැකියා අවස්ථා, උසස් අධ්‍යාපනය ලැබූවන් නැතිකම, දේශපාලන, සංස්කෘතික හෝ සමාජ ආදර්ශ පිළිබඳ කථා නොවීම, වාණිජ හෝ වෙළඳ ක්ෂේත්‍රයේ ආදර්ශ නො වීම සහ නවීකරණ භාවිත කරන අය නො වීම යන ගැටලු ඒකනායක සහ සෙසු අය (2012) විසින් දක්වා ඇත. නගරයෙන් බැහැර දුරස්ථ ප්‍රදේශවල පිහිටීම නිසා ගුරු, සිසු හා ප්‍රජා යන සියල්ලන්ගේ ම සමස්ත ක්‍රියාදාමය කෙරෙහි අහිතකර අන්දමින් බලපෑම, ගුරු භවතුන්ට පැමිණීමේ සහ නවාතැන් ගැනීමේ දුෂ්කරතා, නිවාස සහ පාසල්වල මූලික පහසුකම් නොමැති වීම, පාසල් ප්‍රජා සම්බන්ධතා යහපත් මට්ටමක නොවීම, ඉගෙනීමේ කටයුතු සඳහා දෙමාපිය සහාය නොලැබීම, සමහර පාර්ශ්වකරුවන්ගේ නිෂේධාත්මක ආකල්ප සහ අඩු කැපවීම යන ගැටලු ජයවර්ධන (2003) දක්වා ඇත. ප්‍රජාවේ දරිද්‍රතාව, නූගත්කම, උනන්දුව අඩු වීම, අවම සහභාගිත්වය, දැනුම්වත් බව අඩු වීම, පාසල කෙරෙහි ඇති සෘණ ආකල්ප පැවතීම සහ ප්‍රජා ආකර්ෂණයක් නොමැති වීම යන කරුණු පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) විසින් පෙන්වා දී ඇත. ප්‍රජාව, ගුරුවරුන් සහ විදුහල්පති කෙරෙහි සෑහීමට පත් නො වීම, දීර්ඝ කාලීන ව ප්‍රජාවෙන් හුදකලාව පැවතීම සහ අධ්‍යාපනයේ වටිනාකම පිළිබඳ දෙමාපියන් දැනමුවත් නොවීම යන කරුණු දමයන්ති (2012) දක්වා ඇත.

### 5.2.5 මානව සහ භෞතික සම්පත් සම්බන්ධ ගැටලු

මූලික සම්පත් හිඟකම, ගොඩනැගිලි ව්‍යූහයේ ස්වභාවය (පුද්ගලිකත්වයක් නො වීම) යන ගැටලු ඒකනායක සහ සෙසු අය (2012) දක්වා ඇත. පාසල් ගොඩනැගිලි සහ උපකරණ ප්‍රමාණවත් නොවීම හෝ යල්පැන ගිය ඒවා වීම යන ගැටලු ජයවර්ධන (2003)

දක්වා ඇත. සීමිත ගුරු සංඛ්‍යාවක් සිටීම, ගුරු හිඟය, ගුරුවරුන්ට බලපාන ගමනාගමන දුෂ්කරතා, යන කරුණු පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) දක්වා ඇත. මූල්‍යමය සම්පත් සපයා ගැනීමට අපහසු වීම යන කරුණ දමයන්ති (2012) දක්වා ඇත.

මෙසේ ගැටලු රාශියකට කුඩා පාසල් මුහුණ පා තිබුණ ද, ඇතැම් කුඩා පාසල් විදුහල්පතිවරුන්, ඔවුන්ට මුහුණ දීමට සිදුවන අභියෝග හා බාධක ගැන නො සිතා ඔවුන්ගේ පාසල් සංවර්ධනය කිරීම ද සෑම විට ම පූර්ව සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් අනාගත අභියෝගයන්ට මුහුණ දීමේ උපාය මාර්ග භාවිතය ද සිදු වන බව වාකිෂ්ඨ (2014) අනාවරණය කොට ඇත.

## 5.3 කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නඟා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා

ඒකනායක සහ සෙසු අය (2012), දමයන්ති (2012), ජයවර්ධන (2003), පරාක්‍රමවංශ, සහ කොඩිතුවක්කු (2018) සහ වාකිෂ්ඨ (2014) විසින් කුඩා පාසල්වල පැවැත්ම තහවුරු කිරීම පිණිස පුළුල් පරාසයක නිර්දේශ ඉදිරිපත් කර ඇත. මෙම නිර්දේශ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, මානව සම්පත් කළමනාකරණය, නායකත්වය සහ සාමාන්‍ය කළමනාකරණය, අධීක්ෂණය සහ සුසාධ්‍යකරණය, ප්‍රජා සබඳතා සහ භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍ර යටතේ වර්ග කළ හැකි ය.

### අ.) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ ගුණාත්මක සංවර්ධනය

ඒකනායක සහ සෙසු අය (2012) දක්වන පරිදි ප්‍රජාව තම දරුවන් පාසලට එවීමට පෙලඹෙන්නේ සාධන මට්ටම සම්බන්ධයෙන් පාසල ගොඩ නගා ගෙන ඇති ප්‍රතිරූපය සම්බන්ධයෙන් සෑහීමට පත් වූවහොත් පමණි. එබැවින් ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළ නැංවීම පිණිස ඉහළ ප්‍රමුඛතාවකින් කටයුතු කළ යුතු වේ. දෙමාපියන්ට දැනෙන පරිදි පාසල් අධ්‍යාපනයේ වෙනසක් ඇති කළ යුතු බව දමයන්ති (2012) දක්වා ඇත. ඒ සඳහා යෝජනා කරන ලද ක්‍රියාමාර්ග වන්නේ නිශ්ක්‍රීය ඉගෙනුම් ක්‍රමවේද භාවිතයෙන් දුෂ්කරතා සහිත සමාජ පසුබිම්වලින්

පාසලට පැමිණෙන ශිෂ්‍යයා ඉගෙනීමට පෙලඹවීම අපහසු බැවින් ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද භාවිතයට කුඩා පාසල් ගුරුවරුන් දිරිගැන්විය යුතු බව ය. කුඩා පාසල් නිරන්තර ව මුහුණ පාන ප්‍රධාන අභියෝගයක් ලෙස ගුරු හිඟය පියවාලීමට, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බහු ශ්‍රේණි ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය දිරි ගැන්විය යුතු බව ජයවර්ධන (2003) යෝජනා කොට ඇත. කුඩා පාසල්වල ඉගැන්වීමේ දී ප්‍රතිකාර්ය අධ්‍යාපනය ලබා දීමේ අවශ්‍යතාව වැඩි වශයෙන් පැන නගියි. එම පාසල්වල සාධන ඌනතා සහ කායික මානසික ඌනතාවලට ලක් වූ ළමයින් පන්ති කාමරයේ දී නිතර නිතර හමු වේ. එබැවින් එම සිසුන්ගේ ඉගෙනුම් දුෂ්කරතා හඳුනා ගෙන වඩා සුදුසු ප්‍රතිකාර්ය ඉගැන්වීම් සැලසුම් කර කුඩා පාසල්වල භාවිත කළ යුතු බවත් මෙම පාසල්වල විවිධ තත්ත්වයේ ළමයින් සිටිය හැකි බැවින් ගුරුවරුන් එම සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමෝපාය ද භාවිත කළ යුතු බවත් ඒකනායක සහ සෙසු අය (2012) යෝජනා කොට ඇත. එසේ ම සියලු විෂය, විෂය සමගාමී සහ විෂය බාහිර අත්දැකීම් අනෙකුත් පාසල්වල සිසුන්ට මෙන් ම කුඩා පාසල් සිසුන්ට ද ලබා දිය යුතුයි. ඒ සඳහා කලාප අධ්‍යාපන කාර්යාලවල මැදිහත්වීමෙන් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව ද පෙන්වා දී ඇත.

### ආ.) බහු ශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර ශක්තිමත් කිරීම

Vithanapathirana (2006) පෙන්වා දෙන්නේ බහුශ්‍රේණි පන්ති කාමර සඳහා ප්‍රාථමික ගණිත විෂයමාලාව අනුහුරු කිරීමේ ක්‍රියාමාර්ග නිසා බහුශ්‍රේණි ඉගැන්වීමේ නියුතු ගුරුවරුන්ගේ අවශ්‍යතා තෘප්ත වූ බවත් එය වඩාත් ඵලදායි වූ බවත් ය. පර්යේෂණ මැදිහත් වීම ලෙස ලබා දුන් ගුරු පුහුණුවෙන් ඔවුන්ගේ අවබෝධය සහ කුසලතාව පිළිබඳ ඔවුන් වඩාත් තෘප්තිමත් වී ඇත. බහුශ්‍රේණි ඉගැන්වීම ශක්තිමත් කිරීම පිණිස Vithanapathirana (2006) යෝජනා ඉදිරිපත් කර ඇත. එනම්, මෙම පර්යේෂණයේ මැදිහත් වීමෙන් සිදු කළ විෂයමාලා අනුවර්තනය කුඩා පරිමාණයේ එකක් වන අතර එය ජාතික මට්ටමට යොදා ගැනීම සඳහා මහා පරිමාණ නවෝත්පාදනයක් ලෙස සංවර්ධනය කළ යුතු

ය. ඒ සඳහා පහත සඳහන් කරුණු පිළිබඳ වැඩි පර්යේෂණ මැදිහත් වීමක් කිරීමට යෝජනා කර ඇත. ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ අන්තර්ගතය ප්‍රධාන අවධි සහ ශ්‍රේණි අනුව විශ්ලේෂණය කර නැවත සකස් කළ යුතු ය. බහුශ්‍රේණි ඉගැන්වීම සඳහා ආදර්ශ පාඩම් සැලසුම් කළ යුතු ය. බහුශ්‍රේණි පන්තියක සිසුන් එක වර ඉගෙන ගන්නා බැවින් විවිධ ශ්‍රේණිවල සිසුන්ට වෙන් වශයෙන් භාවිත කළ හැකි ස්වයං ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කළ යුතු ය. බහුශ්‍රේණි ඉගැන්වීමට අනුවර්තනය වීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කළ යුතු ය. එසේ ම බහුශ්‍රේණි ගුරුවරුන් වෘත්තීය වශයෙන් හුදෙකලා වීම වැළැක්වීමට ගුරු සංවර්ධන මධ්‍යස්ථාන මගින් බහුශ්‍රේණි ගුරු රැස්වීම් වාරික ව පැවැත්විය යුතු ය. එසේ ම එම ගුරුවරුන්, ගුරු අධ්‍යාපනඥයන් සහ විෂයමාලා සංවර්ධන අංශ මගින් පවත්වනු ලබන පර්යේෂණවලට සහභාගි කරවා ගත යුතු ය.

### ඇ.) මානව සම්පත් කළමනාකරණය

පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) විසින් නිරන්තර ව කුඩා පාසල් මුහුණ දෙන ගුරු ඌනතා ගැටලුව විසඳීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විධිමත් ක්‍රියාදාමයක් ආරම්භ කළ යුතු බවත් ගුරුවරුන් නිවාඩු ලබා ගැනීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගෙන යාමට සහ පාසලේ කළමනාකරණ කටයුතුවල දී විදුහල්පතිට සහාය වීම සඳහා පාසලට අනුමත ගුරු සංඛ්‍යාවට අතිරේක ව එක් ගුරුභවතකු ලබා දීම සම්බන්ධ ව ද අධ්‍යාපන අමාත්‍යාංශය අවධානය යොමු කළ යුතු බවත් යෝජනා කොට ඇත.

### ඈ.) නායකත්වය සහ සාමාන්‍ය කළමනාකරණය

වාකිෂ්ඨ (2014) විසින් කුඩා පාසලක බොහෝ විට ගුරු හිඟය නිසා විදුහල්පතිවරුන්ට ඉගැන්වීමේ කටයුතු කිරීමට සිදු වන බවත්, ඒ හේතුවෙන් සැලසුම්කරණ සහ කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි වැය කිරීමට ඇත්තේ සීමිත කාලයක් බවත් වාකිෂ්ඨ (2014) දක්වා ඇත. මේ අනුව බලන කල, ශිෂ්‍ය සහ ගුරු සංඛ්‍යාව අතින් පාසල

කුඩා වුව ද, විදුහල්පති භූමිකාව අතිශය සංකීර්ණ ස්වභාවයක් ගනියි. එබැවින් කුඩා පාසල් සඳහා දක්ෂ විදුහල්පතිවරුන් පත් කළ යුතු බව යෝජනා කොට ඇත.

### ඉ.) අධීක්ෂණය සහ සුසාධ්‍යකරණය

පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) අනුව පාසලක සාර්ථක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා බාහිර හා අභ්‍යන්තර අධීක්ෂණය හා නියාමනය ඉතා වැදගත් වේ. මෙම ක්‍රියාවලියේ දී විදුහල්පතිවරයාගේ මැදිහත් වීම සහ අධීක්ෂණය කුඩා පාසලේ අධ්‍යාපන සංවර්ධනයට මූලික බලපෑමක් කරයි. අධීක්ෂණයෙන් මතු වන ගැටලු හඳුනා ගෙන ඒවා විසඳීම සඳහා ක්‍රමෝපාය සැලසුම් කිරීම විදුහල්පතිවරයාගේ ප්‍රධාන කාර්යය විය යුතු ය. පාසල් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ පිහිටුවා ඇති පාසල් සංවර්ධන කමිටුවල කලාප නියෝජිතයන් වශයෙන් කටයුතු කරන අධ්‍යාපන නිලධාරීන්ගේ සහ ගුරු උපදේශකවරුන්ගේ අධීක්ෂණ සහ සුසාධ්‍යකරණ භූමිකාව ශක්තිමත් කිරීම සඳහා කඩිනමින් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කළ යුතු ය. එසේ ම එම නියෝජිතයාගේ වාර්ෂික කාර්යසාධන සැලැස්මට එම පාසලේ මාසික ව පැවැත්වෙන සංවර්ධන කමිටු රැස්වීම් සහභාගිත්වය සහ එම පාසල සුසාධ්‍යකරණ වගකීම ද ඇතුළත් කළ යුතු බවට පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) යෝජනා කොට ඇත.

### ඊ.) ප්‍රජා සබඳතා

විදුහල්පතිවරුන්, ගුරු භවතුන් බලගතු කිරීමෙන් ඔවුන්ගේ වෘත්තීය අභිප්‍රේරණය ශක්තිමත් කිරීම සහ ඔවුන් තුළ පාසලේ හිමිකාරිත්වය පිළිබඳ හැඟීම (Sense of ownership) ඉහළ නැංවීම, ප්‍රදේශයේ ප්‍රජාව සමග ස්ථිර ව ඉදිරියට ගමන් කරන සබඳතා ඉහළ නැංවීමෙන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යයන් ඇතුළත් පාසල් පාර්ශ්වකරුවන්ට පාසලේ කටයුතු සම්බන්ධ ව ප්‍රබල හඬක් නැඟීමට ඉඩකඩ ලබා දීම, පාසලට ඔවුන්ගේ සහාය ලබා ගැනීම සහ පාසලේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම හා තීරණවල අදාළත්වය ඉහළ නැංවීම

අවශ්‍ය වෙයි (World Bank, 2011). දමයන්ති (2012) අනුව ඉගෙනුම සම්බන්ධ ව දරුවන් පෙලඹවීමට පාසලේ දී මෙන් ම නිවෙස් පරිසරය ද ඉතා වැදගත් වන බැවින් ඒ පිළිබඳ ව දෙමාපියන්ගේ අවබෝධය සහ අවධානය යොමු කළ යුතු බැවින් අධ්‍යාපනය පිළිබඳ දෙමාපියන්ගේ අවබෝධය ඉහළ නැංවීමට පාසල ක්‍රියා කළ යුතු බව දමයන්ති (2012) දක්වා ඇත. ජයවර්ධන (2003) යෝජනා කරන්නේ තම දරුවන්ට ඉගෙනුම් අත්දැකීම් සැපයීමට තම නිවෙස් පරිසරය සකස් කර ගැනීමට සහ එහි දී දෙමාපියන් මැදිහත් විය යුතු අන්දම පිළිබඳ ව පාසල මගින් දෙමාපියන් දැනමුවත් කළ යුතු බව ය (ජයවර්ධන, 2003). කුඩා පාසල් ආසන්න ව පවතින ජනප්‍රිය පාසල්වලට අනුබද්ධ කිරීමෙන් සම්පත් පරිහරණයේ දී කුඩා පාසල්වල ශිෂ්‍යයන්ට වාසිදායක වේ. කුඩා පාසල් මගින් අධ්‍යාපනය ප්‍රජාවට කාන්දු කළ යුතු අතර පාසල ශිෂ්‍යයන්ට පමණක් නොව තරුණ, වැඩිහිටි සැමට තොරතුරු ලබා දීමත්, ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් නායකත්වය දීමත් අවශ්‍ය ය. මේ සඳහා කුඩා පාසල ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කළ යුතු ය (ජයවර්ධන, 2003). කුඩා පාසල් කේන්ද්‍ර කර ගෙන නොවිධිමත් වැඩසටහන් ආරම්භ කළ යුතු ය. විශේෂයෙන් ම කුඩා පාසල් නඟා සිටුවීම පිණිස මහා පරිමාණ වාණිජ ආයතන සහ ස්වේච්ඡා සංවිධානවල සහාය ලබා දීමට රජයේ මැදිහත් වීමෙන් සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි තව දුරටත් දක්වයි (ජයවර්ධන, 2003).

### උ.) භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය

ඒකනායක සහ සෙසු අය (2012) අනුව පාසල් අතර සම්පත් බෙදී යාමේ දී සම්පත්වල සර්ව සාම්‍යයක් තිබිය යුතු ය. එහෙත් සම්පත් ගලා යාමේ දී කුඩා පාසල් සම්බන්ධයෙන් සම්පත් විෂමතාවක් පවතින බව ඒකනායක සහ සෙසු අය (2012) පෙන්වා දෙන අතර මෙම තත්ත්වය කුඩා පාසල්වල සාධන මට්ටම් කෙරෙහි ද බලපා ඇත. එසේ ම සෑම පාසලක ම අවශ්‍යතා සොයා බලා සම්බන්ධීකරණය පාසල් සංවර්ධන කමිටුවල කලාප නියෝජිතයා

වෙත පැවරිය යුතු බවට ඒකනායක සහ සෙසු අය යෝජනා කරති (2012). පාසල් පිරියත ආකර්ෂණීය අන්දමින් පවත්වා ගෙන යාම, විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සම්පත් සපයා දීම වැදගත් බව දමයන්ති (2012) දක්වා ඇත. කුඩා පාසල් සංවර්ධනය පිණිස විශේෂ මූල්‍යාධාර සැපයීමට පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) යෝජනා ඉදිරිපත් කර ඇත.

## 6.0 උක්ත අනාවරණ භාවිත කරමින් ශ්‍රී ලාංකේය කුඩා පාසල් පද්ධතිය නඟා සිටුවීම පිණිස ඉදිරිපත් කරනු ලබන නිර්දේශිත පියවර

මෙහි දී ඉහතින් දක්වන ලද අධ්‍යයන වාර්තා වන ඒකනායක සහ පිරිස (2012), ජයවර්ධන (2003), කස්තුරිආරච්චි (2013), වාකිෂ්ඨ (2014), පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) දමයන්ති (2012) සහ Vithanapathirana (2006) විසින් අනාවරණය කර ඇති ශ්‍රී ලංකාවේ කුඩා පාසල්වල දක්නට ලැබෙන ප්‍රබලතා, ඒවා මුහුණ පා ඇති ගැටලු, කුඩා පාසල් වැසී යාම වැළැක්වීමට සහ ඒවා නඟා සිටුවීම පිණිස ඉදිරිපත් කර ඇති නිර්දේශ සහ යෝජනා ගැඹුරින් විමර්ශනය කිරීමෙන් ද, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය පිළිබඳ වෙනත් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ පදනම් කර ගනිමින් ද ශ්‍රී ලාංකේය කුඩා පාසල් පද්ධතිය නඟා සිටුවීම පිණිස පහත නිර්දේශිත පියවර ඉදිරිපත් කෙරේ.

**6.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ කුඩා පාසල් ඒකකයක් ස්ථාපිත කිරීම -** ඒකනායක සහ පිරිස (2012) අවධාරණය කරන පරිදි ග්‍රාමීය ප්‍රජාවගේ දියුණුවට කුඩා පාසල් පද්ධතියේ පැවැත්ම ඍජු ලෙස ම බලපාන බැවින් ද, අනෙකුත් පාසල් සමඟ සැලකීමේ දී කුඩා පාසල්වල හැසිරීම වෙනස් බැවින් මෙම කුඩා පාසල් පද්ධතිය රැක බලා ගත යුතු ය. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙන ම ඒකකයක් ස්ථාපිත කළ යුතු ය. ඒ යටතේ කුඩා පාසල්වල මනා ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම පිණිස සුදුසු වැඩපිළිවෙළක් ස්ථාපිත කළ යුතු ය. විශේෂයෙන් ම කුඩා පාසල් පිළිබඳ ජනතා අවධානය

යොමු කරවීම පිණිස ජනමාධ්‍ය ද උපයෝගී කර ගත යුතු ය. එමෙන් ම කුඩා පාසල් යන පදය භාවිතයෙන් පාසල් ප්‍රජාව තුළ පාසල පිළිබඳ අවතක්සේරුවක් ඇති විය හැකි බැවින් ඒ සඳහා වෙනත් සුදුසු පදයක් භාවිතය ද වැදගත් වේ.

**6.2 විදුහල්පති නායකත්වය -** කස්තුරිආරච්චි (2013) සහ වාකිෂ්ඨ (2014) පෙන්වා දෙන පරිදි කුඩා පාසල් සංවර්ධනය කිරීමේ ලා නවෝත්පාදන සැලකූ විට ඒවායේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ විදුහල්පතිගේ නායකත්ව කුසලතාවයි. එබැවින් කුඩා පාසල් බල ගැන්වීම පිණිස දක්ෂ විභව්‍යතා සහිත විදුහල්පතිවරුන් පත් කළ යුතු ය. එම විදුහල්පතිවරුන්ට කුඩා පාසල් කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු වීම් ලබා දිය යුතු ය.

**6.3 සුවිශේෂි ගුරු, විදුහල්පති පුහුණු පාඨමාලා සහ අභිප්‍රේරණය -** ඒකනායක සහ පිරිස (2012) සහ ජයවර්ධන (2003) අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ සාකච්ඡා කරන ලද ක්‍රියාකාරී ඉගෙනුම්, බහු ශ්‍රේණි ඉගැන්වීම් සහ අන්තර්කරණය යන සුවිශේෂ ඉගැන්වීම් ක්‍රමෝපා පිළිබඳ ව එම පාසල්වල ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ට සුවිශේෂ පුහුණු ලබා දිය යුතු ය. කුඩා පාසල්වල ගුරුභවතුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ සුවිශේෂි දායකත්ව ඇගයීමට සහ ඔවුන් අභිප්‍රේරණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු ය.

**6.4 බහු ශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර ප්‍රවර්ධනය -** Vithanapathirana (2006) සහ ජයවර්ධන (2003) බහුශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර ප්‍රවර්ධනය පිණිස යෝජනා ඉදිරිපත් කර ඇත. කුඩා පාසල්වල ඒකක පිරිවැය ඉහළ යාම සහ ගුරු ශිෂ්‍ය අනුපාතය පහළ යාම නිසා ඇති වන අධ්‍යාපන නාස්තිය අවම කිරීමට බහුශ්‍රේණි ඉගැන්වීම් ව්‍යවහාර ප්‍රවර්ධනය කළ යුතු ය. මේ සඳහා බහුශ්‍රේණි ඉගැන්වීම් සඳහා ගැළපෙන පරිදි විෂයමාලා අනුහුරු කිරීම, බහුශ්‍රේණි ඉගැන්වීම සඳහා ආදර්ශ පාඩම් සැලසුම් කිරීම, බහුශ්‍රේණි පන්තියක

සිසුන්ට වෙන් වශයෙන් භාවිත කළ හැකි ස්වයං ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම, එම ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය, එම ගුරු රැස්වීම් වාරික ව පැවැත්වීම සහ බහුශ්‍රේණි ඉගැන්වීම් පර්යේෂණාත්මක ප්‍රවේශයකින් වැඩි දියුණු කිරීම යන යෝජනා ඉදිරිපත් කෙරේ.

**6.5 ප්‍රජා දායකත්වය සහ ප්‍රජා සංවර්ධනය -** පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) සහ දමයන්ති (2012) අනුව කුඩා පාසල් සංවර්ධනයේ දී ප්‍රජාවේ දායකත්වය ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය පිණිස පාසල කටයුතු යෙදිය යුතු ය. දරුවන්ගේ දෛනික පාසල් පැමිණීම, දරුවන් ඉගෙනීමේ කාර්යය සඳහා උනන්දු කරවීම යන කරුණු සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. ප්‍රජා දායකත්වය සහ ශිෂ්‍ය අභිප්‍රේරණය ඉහළ නැංවීම පිණිස ප්‍රජා සම්පත් දායකයන් ලවා ප්‍රාදේශීය කර්මාන්ත සහ ප්‍රාදේශීය සංස්කෘතික අංග ඇතුළත් දේශීය ඥානය (Local wisdom) පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පාසලේ කටයුතු සම්පාදනය කළ යුතු වේ. එසේ ම පාසලේ සංවර්ධනය පිණිස ද දෙමාපියන්ගේ සහභාගිත්වය ලබා ගත යුතු ය. පාසල විසින් ද ප්‍රජාව වෙනුවෙන් නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කළ යුතු ය.

**6.6 අධීක්ෂණය සහ සුසාධ්‍යකරණය -** පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) පෙන්වා දෙන පරිදි බාහිර අධීක්ෂණය සම්බන්ධයෙන් සැලකූ විට, පාසල තම ස්වාධීනත්වය පවත්වා ගන්නා අතරතුර ම එහි කාර්ය මණ්ඩලයට තමන් තුළ පවත්නා විභව්‍යතා ප්‍රත්‍යක්ෂ කර ගනිමින් පාසල සියලු අංශවලින් ඉහළ නැංවීම පිණිස එම විභව්‍යතා උපයෝගී කර ගැනීමට මාර්ගෝපදේශ සැපයීම සඳහා සහායිත අධීක්ෂණ පටිපාටියක් ස්ථාපිත කළ යුතු ය. එවැනි සහායක් සහිත ව කුඩා පාසල්වල බොහෝමයක් ගැටලු පාසල් කළමනාකරණය ශක්තිමත් කිරීම මගින් පාසල අභ්‍යන්තරයේ ම විසඳීමෙන් පාසලෙන් ගුණාත්මක අධ්‍යාපනයක් සැපයිය හැකි ය. මේ සඳහා පාසල් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පාසලට පත් කර ඇති කලාප

නියෝජිතයාට එම පාසලේ සුසාධ්‍යකරණ වගකීම පැවරිය යුතු ය. පාසල් බාහිර ඇගයීමේ දී ඇගයීමට ලක් කරන සියලු ක්ෂේත්‍ර මෙන් ම පංති කාමර ඇගයීම පිණිස සෑම පාසලක් සඳහා එක ම නිර්ණායක යොදා ගැනීම උචිත නැත. විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් සහ කුඩා ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් සන්දර්භය එකිනෙකට වෙනස් ය. එබැවින් කුඩා පාසල් බාහිර ඇගයීම පිණිස වෙන ම නිර්ණායක හඳුනා ගැනීම උචිත වේ.

**6.7 සම්පත්කරණය -** ජයවර්ධන (2003), පරාක්‍රමවංශ සහ කොඩිතුවක්කු (2018) අවධාරණය කරන පරිදි ඕනෑම පාසලකට ප්‍රශස්ත ඉගෙනුම් මට්ටමක් සාධනය කර ගැනීමට අවශ්‍ය සම්පත් මොනවා දැයි වාස්තවික මිනුම් ක්‍රම මගින් තීරණය කළ යුතු ය. එසේ තීරණය කර ගත් සම්පත් දැනට තිබෙන පාසල් අවශ්‍යතා සලකා ප්‍රමුඛතා ලේඛනයකට අනුව ලැයිස්තු ගත කළ යුතු ය. තිබෙන මූල්‍ය ප්‍රතිපාදනවලින් එම ප්‍රමුඛතා ලේඛන අනුව සම්පත් අවශ්‍යතා සැපිරිය යුතු ය. මේ සඳහා පාසල් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ පාසලට පත් කර ඇති කලාප නියෝජිතයාට පාසලේ අවශ්‍යතා සොයා බලා සම්බන්ධීකරණය පැවරිය යුතු ය.

## 7.0 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධ්‍යාපන අමාත්‍යාංශය (2007) අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන.

ඒකනායක එස්. බී. සහ සෙසු අය (2012) *ශ්‍රී ලංකාවේ කුඩා පාසල් සඳහා සම්පත් කට්ටලයක්*. පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ ගුරු අධ්‍යාපන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

කුලරත්න, ඩබ්. ජී. (2015) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විප්ලවකාරී වෙනසක් අවශ්‍ය ය, රාවය පුවත්පත. 2015- 08 -30 උපුටා ගන්නා ලද්දේ *http://ravaya.lk/?author=132, Retrieved on 5th May, 2018.*

ජයවර්ධන ඒ. ඒ. (2003) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බහුශ්‍රේණි පාසල්වල පැන නැගී ඇති ගැටලු පිළිබඳ අධ්‍යයනයක්. ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ සඟරාව, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

ජාතික අධ්‍යාපන ආයතනය (2009) ශ්‍රී ලංකා අධ්‍යාපනයේ දශක හතරක විකාශය. 1969 - 2009. පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගම.

දමයන්ති කේ. එච්. එන්. (2012) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජ සංවර්ධනය සඳහා කුඩා පාසල් භාවිත කිරීම. අධ්‍යාපන පර්යාලෝක 1 (1), පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

පරාක්‍රමවංශ, එස්. සහ කොඩිතුවක්කු, කේ. ඒ. ජේ. ඒ. (2018) පාසල් නඟා සිටුවීමේ වැඩසටහන කුඩා පාසල්වල ක්‍රියාත්මක වන ආකාරය. අධ්‍යාපන පර්යාලෝක 7(1), පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

ප්‍රේමසිරි, කේ. ඒ. ඒ. ඩී. එන්. (2013) පාසල් වැසී යාමට හේතු. අධ්‍යාපන පර්යාලෝක 1(2), පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

රත්නායක ආර්. එම්. ඩී. (2008) සංවර්ධනයේ පියසටහන්. - බ/ වලස්බැද්ද විදුහල පිළිබඳ පර්යේෂණ වාර්තාව. විදුහල්පති පර්යේෂණ සහ ප්‍රත්‍යවේක්ෂණ, 2008-5, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

ලේකම්ගේ, එස්. එස්. ආර්. (2008) ප්‍රතිව්‍යුහගතකරණය නිසා ඇති වූ ගැටලු හඳුනා ගෙන පාසල ගොඩ නැගූ අයුරු පිළිබඳ අධ්‍යයනයක්-. පුවක්පිටිය මානකඩ කනිෂ්ඨ විද්‍යාලය පිළිබඳ පර්යේෂණ වාර්තාව. - විදුහල්පති පර්යේෂණ සහ ප්‍රත්‍යවේක්ෂණ, 2008-4, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

වාකිෂ්ඨ, එස්. පී. ඩබ්. (2014) *කුඩා පාසල්වල විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ උපායමාර්ග භාවිතයේ සුවිශේෂිතා පිළිබඳ අධ්‍යයනයක්*. අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලැබූ පර්යේෂණ නිබන්ධය.

වාසලමුදලි එච්. (2008) ශිෂ්ටත්වයෙන් විශිෂ්ටත්වයට - ත්‍රි/ මහවැලි පුර විද්‍යාලය පිළිබඳ පර්යේෂණ වාර්තාව. විදුහල්පති පර්යේෂණ සහ ප්‍රත්‍යවේක්ෂණ, 2008 - 2, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

සර්මා වෙන්කටේෂ්වරන්, ලයිච්ට් ස්ටෙෆනී සහ කළුගලගෙදර තුෂානි (2018) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අසමානතා: ජාතික දත්ත හා ප්‍රවේශය, ගුණාත්මකභාවය හා ඉගැනුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රාදේශීය නිරීක්ෂණ; දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය අධ්‍යයන මාලා අංක 10 - 2018 නොවැම්බර්, උපුටා ගන්නා ලද්දේ http://www.cepa.lk/content_images/publications/documents/english-20190212081339.pdf

සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව (2009). ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක්, සංදර්භය, ගැටලු සහ යෝජනා, අවසන් වාර්තාව

හියුබට් ඒ. ඒ. ඒ. (2008) අරුණෝදයේ පියසටහන්, සු/ ජොහානාදන් කණිටු විදුහල පිළිබඳ පර්යේෂණ වාර්තාව. විදුහල්පති පර්යේෂණ සහ ප්‍රත්‍යවේක්ෂණ, 2008-1, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ, සැලසුම් සහ සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

Bray, M. (2007) Are small schools the answer? Cost effective strategies for rural school provision; Commonwealth Secretariat, London (England), Retrieved from https://files.eric.ed. gov/ fulltext/ ED340537.pdf

Galdas P, Darwin Z, Fell J, et al. (2015) Health services and delivery research, No. 3.34. Southampton (UK): NIHR Journals Library; 2015 Aug. Retrieved from https://www.ncbi.nlm.nih.gov/ books/NBK311090/.

Kasturi Arachchi C. (2013) A case study: Developmental strategies used by principals to develop small schools in Sri Lanka; Gian Jyotie E Journal, 3(2), (Apr-Jun 2013) ISSN 2250-348X(27-42).

Little, W. (2014) *Introduction to Sociology – 1st Canadian Edition,* Victoria, B.C.: BC campus. Retrieved from https://opentext.

Mendis, G. (1990) Education in Sri Lanka and small schools' development programme, Pannipitiya; Dushan's Printers.

National Education Commission, (NEC) (2003) *Rationalisation of schools study; (*ed.) Swarna Jayaweera, Series No. 5, Narahenpita: National Education Commission.

Perera, M A N R. (2012) School dropouts in Sri Lanka: A sociological analysis conference paper · November 2012; Retrieved from https://www.researchgate.net/publication/311887011.

Seers K. (2014) Qualitative systematic reviews: their importance for our understanding of research relevant to pain British Journal of Pain 2015, 9(1) 36–40 Retrieved from sagepub.co.uk/.


UNESCO (2008) Overcomming inequality: Why governance matters. Education for All global monitoring report, Paris: UNESCO.

Vithanapathirana, M. (2006) Adapting the primary mathematics curriculum to the multigrade classroom in rural Sri Lanka; In Little, Angela. (2006). Education for all and multigrade teaching: Challenges and opportunities. Springer; Retrieved from www.ioe.ac.uk/multigrade

World Bank – FTI Secretariat (2011) An impact evaluation of Sri Lanka's policies to improve the performance of schools and primary school students through its school improvement and school report card program, The World Bank, Washington DC and Colombo.

**ඇමුණුම 1**

## ශිෂ්‍ය සංඛ්‍යාව 1-100 දක්වා වූ පාසල් ව්‍යාප්තිය (2019)




**ප්‍රභවය: පාසල් සංගණනය -2019**

# ශිෂ්‍ය ජනගහනය 100 නොඉක්මවන පාසල්වල දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාප්තිය - 2019

| දිස්ත්‍රික්කය | ශිෂ්‍ය සංඛ්‍යාව 1-50 අතර ප්‍රාථමික පාසල් | සමස්ත පාසල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | ශිෂ්‍ය සංඛ්‍යාව 51 - 100 අතර අනෙකුත් පාසල් | සමස්ත පාසල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | ශිෂ්‍ය සංඛ්‍යාව 1 - 100 අතර සමස්ත පාසල් | ශිෂ්‍ය සංඛ්‍යාව 1 - 100 අතර සමස්ත පාසල් ප්‍රතිශතය | දිවයිනේ සමස්ත පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 18 | 4.5 | 29 | 7.2 | 47 | 11.7 | 401 |
| ගම්පහ | 17 | 3.2 | 42 | 7.8 | 59 | 11.0 | 536 |
| කළුතර | 43 | 10.3 | 55 | 13.1 | 98 | 23.4 | 419 |
| මහනුවර | 99 | 15.2 | 85 | 13.1 | 184 | 28.3 | 650 |
| මාතලේ | 54 | 17.0 | 50 | 15.8 | 104 | 32.8 | 317 |
| නුවර එළිය | 78 | 14.2 | 115 | 20.9 | 193 | 35.1 | 550 |
| ගාල්ල | 44 | 10.2 | 62 | 14.4 | 106 | 24.7 | 430 |
| මාතර | 46 | 12.8 | 52 | 14.5 | 98 | 27.4 | 358 |
| හම්බන්තොට | 32 | 10.0 | 38 | 11.8 | 70 | 21.8 | 321 |
| යාපනය | 95 | 21.2 | 106 | 23.7 | 201 | 44.9 | 448 |
| මන්නාරම | 42 | 31.3 | 20 | 14.9 | 62 | 46.3 | 134 |
| වවුනියාව | 73 | 42.0 | 21 | 12.1 | 94 | 54.0 | 174 |
| මුලතිව් | 35 | 27.6 | 20 | 15.7 | 55 | 43.3 | 127 |
| කිලිනොච්චිය | 19 | 18.3 | 15 | 14.4 | 34 | 32.7 | 104 |
| මඩකලපුව | 62 | 17.2 | 46 | 12.8 | 108 | 30.0 | 360 |
| අම්පාර | 47 | 10.7 | 63 | 14.4 | 110 | 25.1 | 439 |
| ත්‍රිකුණාමලය | 42 | 13.4 | 55 | 17.6 | 97 | 31.0 | 313 |
| කුරුණෑගල | 117 | 13.4 | 132 | 15.1 | 249 | 28.5 | 875 |
| පුත්තලම | 18 | 4.9 | 43 | 11.6 | 61 | 16.4 | 371 |
| අනුරාධපුරය | 84 | 14.9 | 89 | 15.8 | 173 | 30.7 | 563 |
| පොළොන්නරුව | 26 | 10.3 | 49 | 19.4 | 75 | 29.6 | 253 |
| බදුල්ල | 110 | 18.2 | 108 | 17.9 | 218 | 36.0 | 605 |
| මොණරාගල | 40 | 13.7 | 38 | 13.0 | 78 | 26.6 | 293 |
| රත්නපුරය | 112 | 18.7 | 79 | 13.2 | 191 | 31.8 | 600 |
| කෑගල්ල | 115 | 21.9 | 86 | 16.4 | 201 | 38.4 | 524 |
| | **1,468** | **14.4** | **1,498** | **14.7** | **2,966** | **29.2** | **10,165** |

| | | |
|---|---|---|
| (කහ) | කුඩා පාසල් සංඛ්‍යාව සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 50%ට වැඩි | දිස්ත්‍රික්ක 1 |
| (කොළ) | කුඩා පාසල් සංඛ්‍යාව සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 40% - 49.9%ත් අතර | දිස්ත්‍රික්ක 3 |
| (නිල්) | කුඩා පාසල් සංඛ්‍යාව සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 30% - 39.9%ත් අතර | දිස්ත්‍රික්ක 9 |